# <u>මහා සභා වාර්තාව - කටුවන ප්‍රාදේශීය සභාව</u>

## <u>2018 අප්‍රේල් මස 19 වන දින</u>

- **8 වන සැසි වාරයේ 01 වන සභා වාර්තාව.**

**දිනය :- 2018.04.19 වන දින**

**වේලාව:- පෙ.ව. 10.00**

**ස්ථානය :- ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව - මිද්දෙනිය**

| <u>පැමිණීම</u> | <u>පැමිණි වෙලාව</u> |
|---|---|
| 01. ගරු සභාපති අයි.ජී.මහින්ද මැතිතුමා | පෙ.ව. 10.00 |
| 02. ගරු උප සභාපති එම්.ජයන්ත මැතිතුමා | පෙ.ව. 10.00 |
| 03. ගරු ප්‍රා.ස.ම.යූ.ජී.ධර්මසිරි මැතිතුමා | පෙ.ව. 10.00 |
| 04. ගරු ප්‍රා.ස.ම.සිරිසේන හෙට්ටිගේ මැතිතුමා | පෙ.ව. 10.00 |
| 05. ගරු ප්‍රා.ස.ම.සුගත් සරඹගේ මැතිතුමා | පෙ.ව. 10.00 |
| 06. ගරු ප්‍රා.ස.ම.කේ.ඒ. ප්‍රේමතිලක මැතිතුමා | පෙ.ව. 10.00 |
| 07. ගරු ප්‍රා.ස.ම.එච්.ඒ. ගාමිණී සංජීව මැතිතුමා | පෙ.ව. 10.00 |
| 08. ගරු ප්‍රා.ස.ම.අයි.කේ. සුසන්ත මැතිතුමා | පෙ.ව. 10.00 |
| 09. ගරු ප්‍රා.ස.ම.එම්.පී.සී. කැලුම් තුෂාර ගරුසිංහ මැතිතුමා | පෙ.ව. 10.00 |
| 10. ගරු ප්‍රා.ස.ම.ඩබ්.ඒ. සංජීව මැතිතුමා | පෙ.ව. 10.00 |
| 11. ගරු ප්‍රා.ස.ම.මානෙල් දිසානායක මැතිතුමිය | පෙ.ව. 10.00 |
| 12. ගරු ප්‍රා.ස.ම.ඩබ්.එච්.ඒ. සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා | පෙ.ව. 10.00 |
| 13. ගරු ප්‍රා.ස.ම.ඒ.පී. නිශාන්ත කුමාර මැතිතුමා | පෙ.ව. 10.00 |
| 14. ගරු ප්‍රා.ස.ම.රමනි හල්පෙ ගමගේ මැතිතුමිය | පෙ.ව. 10.00 |
| 15. ගරු ප්‍රා.ස.ම.ගාමිණී ජයවික්‍රම මැතිතුමා | පෙ.ව. 10.00 |
| 16. ගරු ප්‍රා.ස.ම.ශාන්ත ජයලත් මැතිතුමා | පෙ.ව. 10.00 |
| 17. ගරු ප්‍රා.ස.ම.කේ.සුනිල් ශාන්ත කුමාර මැතිතුමා | පෙ.ව. 10.00 |
| 18. ගරු ප්‍රා.ස.ම.කේ.එච්. චන්ද්‍රසේන මැතිතුමා | පෙ.ව. 10.00 |
| 19. ගරු ප්‍රා.ස.ම.එම්.ඩී.සුගතදාස මැතිතුමා | පෙ.ව. 10.00 |
| 20. ගරු ප්‍රා.ස.ම.ආරියරත්න ඒකනායක මැතිතුමා | පෙ.ව. 10.00 |
| 21. ගරු ප්‍රා.ස.ම.කේ.රන්ජන් වීරසේකර මැතිතුමා | පෙ.ව. 10.00 |
| 22. ගරු ප්‍රා.ස.ම.එන්.ඒ.එස්. වීරසිරි මැතිතුමිය | පෙ.ව. 10.00 |
| 23. ගරු ප්‍රා.ස.ම.ඩබ්.සී.එම්.චමිල් උදාර මැතිතුමා | පෙ.ව. 10.00 |
| 24. ගරු ප්‍රා.ස.ම.ජේ.චන්ද්‍රලතා මැතිතුමිය | පෙ.ව. 10.00 |
| 25. ගරු ප්‍රා.ස.ම.ඩී.රාජපක්ෂ මැතිතුමිය | පෙ.ව. 10.00 |

26. ගරු ප්‍රා.ස.ම.පී.එන්.එස්. ගුණවර්ධන මැතිතුමිය පෙ.ව. 10.00

27. ගරු ප්‍රා.ස.ම.එච්.ඒ ප්‍රදීපා නිසංසලා මැතිතුමිය පෙ.ව. 10.00

28. ගරු ප්‍රා.ස.ම.ඊ.බී. ඉන්දික මැතිතුමා පෙ.ව. 10.00

29. ගරු ප්‍රා.ස.ම.එම්.සිරිසේන මැතිතුමා පෙ.ව. 10.00

30. ගරු ප්‍රා.ස.ම.ඩබ්.ඩී.එම්.ඩී. හරිස්චන්ද්‍ර මැතිතුමා පෙ.ව. 10.00

**සහභාගි වූ නිලධාරීන්**

01. ලේකම් - ඩබ්.කේ. සුරංග මහතා.
02. සංවර්ධන නිලධාරී - ඒ.බී.කේ. සෙව්වන්දි මිය.

## 01. ආගම සිහි කිරීම හා ගරු සභාපතිතුමා විසින් සභාව පිළිගැනීම

ගරු සභාපතිතුමා, හිටපු සභාපතිවරු දෙපළ ඇතුළු පැමිණි සිටි ගරු මන්ත්‍රීතුමන්ලා හා ගරු මන්ත්‍රීතුමියන් මෙන්ම නිලධාරී මණ්ඩලය ප්‍රථමයෙන් ආගම සිහි කරන ලදි. ඉන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් සභාවේ වැඩ ආරම්භ කරන ලදි. සියළු දෙනාටම සුබ උදෑසනක් හා සුබ දවසක් වේවා. ගරු උප සභාපතිතුමා , ඒ වාගේම හිටපු සභාපතිවරු දෙපළගෙන් හා ගරු මන්ත්‍රීවරු සියළු දෙනාගෙන්ද ලේකම් මහතා ඇතුළු නිලධාරීතුමියගෙන්ද මාධ්‍යවේදී මහතාගෙන්ද අවසරයි. අද දවසේ කටුවන ප්‍රාදේශීය සභාවේ 8 වන සැසිවාරයේ මංගල සභා වාරය ආරම්භ වුණා. ඒ සඳහා සහභාගි වූ ගරු උප සභාපතිතුමා, හිටපු සභාපතිවරු දෙදෙනාද , ගරු මන්ත්‍රීතුමන්ලා හා ගරු මන්ත්‍රීතුමියන් සියළු දෙනා ඉතාම ආදරයෙන් හා ගෞරවයෙන් පිළිගනු ලබනවා. ඒ වාගේම ලේකම් මහතා ඇතුළු නිලධාරී තුමිය හා මාධ්‍යවේදී මහතා ඉතාම ආදරයෙන් හා ගෞරවයෙන් පිළිගනු ලබනවා. මින් ඉදිරියට න්‍යාය පත්‍රානුකූලව සභාවේ වැඩ කටයුතු සිදු කරමු යැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

## 02 . ජාතික ගීය ගායනා කිරීම

ගරු සභාපතිතුමා ඇතුළු පැමිණි සිටි ගරු මන්ත්‍රීතුමන්ලා හා නිලධාරී මණ්ඩලය ජාතික ගීය ගායනා කරන ලදි.

## 03 . රට දැය වෙනුවෙන් දිවි පිදූ රණ විරුවන් සිහි කිරීම

මංගල සභා වාරය සඳහා සහභාගි වූ ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනා රට දැය වෙනුවෙන් දිවි පිදූ රණවිරුවන් සිහි කරන ලදි.

## 04 . ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන

නව සභා ධූර කාලය ආරම්භ වීම සමඟ නවක මන්ත්‍රීවරු මෙන්ම නවක මන්ත්‍රීතුමියන් සභාවට පැමිණියා. අප සියළු දෙනාගේ සුහදතාවය වර්ධනය කර ගැනීමේ අරමුණින් මන්ත්‍රීවරු හඳුනා ගැනීම සිදු කරමු.

ඒ අනුව සභාවට පැමිණි ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන්ලා සියළු දෙනා හඳුනාගැනීම සිදු කරන ලදි.

## 05 . ප්‍රාදේශීය සභාව අමතා එවා ඇති සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන -

**නැත**

## 06 . යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත

## 07 . කමිටු පත් කිරීම

**( ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා )**

2018 වර්ෂය සඳහා සභාවේ කටයුතු වෙනුවෙන් පහත සඳහන් කමිටුවලට සාමාජිකයින් පත් කිරීම සුදුසු බව යෝජනා කරමි.

- මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුව.
- කර්මාන්ත කමිටුව.
- නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු.
- ටෙන්ඩර් කමිටුව.
- පරිසර හා පහසුකම් කමිටුව.
- තාක්ෂණික කමිටුව.
- ආගමික සහජීවනය පිළිබඳ කමිටුව.

එම යෝජනාව ගරු.ප්‍රා.ස.ම. කේ. ඒ. ප්‍රේමතිලක මැතිතුමා ස්ථිර කරන ලදි.

### 7-1. මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුව

- ගරු සභාපති අයි.ජී.මහින්ද මැතිතුමා — සභාපති
- ගරු ප්‍රා.ස.ම.කේ.ඒ. ප්‍රේමතිලක මැතිතුමා — සාමාජික
- ගරු ප්‍රා.ස.ම.සිරිසේන හෙට්ටිගේ මැතිතුමා — සාමාජික
- ගරු ප්‍රා.ස.ම.කේ.එච්. චන්ද්‍රසේන මැතිතුමා — සාමාජික
- ගරු ප්‍රා.ස.ම.රමනි හල්පෙ ගමගේ මැතිතුමිය — සාමාජික
- ලේකම් - ඩබ්.කේ. සුරංග මහතා — සාමාජික
- කළමනාකරණ සහකාර ඩිලාන් සංජන මහතා — සාමාජික
- විෂයභාර නිලධාරී — සාමාජික

සුදුසු යැයි ගරු ප්‍රා.ස.ම එච්.ඒ. ගාමිණී සංජීව මැතිතුමා කළ යෝජනාව ගරු ප්‍රා.ස.ම. මානෙල් දිසානායක මැතිතුමියගේ ස්ථිරත්වයෙන් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

### 7- 2. කර්මාන්ත හා සේවා කමිටුව

- ගරු සභාපති අයි.ජී.මහින්ද මැතිතුමා — සභාපති
- ගරු ප්‍රා.ස.ම.අයි.කේ. සුසන්ත මැතිතුමා — සාමාජික
- ගරු ප්‍රා.ස.ම.ඩබ්.ඩී.එම්.ඩී. හරිස්චන්ද්‍ර මැතිතුමා — සාමාජික
- ගරු ප්‍රා.ස.ම.මානෙල් දිසානායක මැතිතුමිය — සාමාජික
- ගරු ප්‍රා.ස.ම.සුගත් සරඹගේ මැතිතුමා — සාමාජික
- තාක්ෂණ සේවා නිලධාරී - ආර්.ජී. සමන් මහතා — සාමාජික
- කර්මාන්ත විෂයභාර නිලධාරී — සාමාජික

සුදුසු යැයි ගරු ප්‍රා.ස.ම කේ. ඒ. ප්‍රේමතිලක මැතිතුමා කළ යෝජනාව ගරු ප්‍රා.ස.ම. සිරිසේන හෙට්ටිගේ මැතිතුමාගේ ස්ථිරත්වයෙන් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

### 7- 3. නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව

- ගරු ප්‍රා.ස.ම.යූ.ජී.ධර්මසිරි මැතිතුමා — සභාපති
- ගරු ප්‍රා.ස.ම.කේ.සුනිල් ශාන්ත කුමාර මැතිතුමා — සාමාජික
- ගරු ප්‍රා.ස.ම.ඩබ්.සී.එම්. චමිල් උදාර මැතිතුමා — සාමාජික

- ගරු ප්‍රා.ස.ම.ශාන්ත ජයලත් මැතිතුමා සාමාජික
- ලේකම් - ඩබ්.කේ. සුරංග මහතා සාමාජික
- නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරී - 01 සාමාජික
- විෂයභාර නිලධාරී සාමාජික

සුදුසු යැයි ගරු ප්‍රා.ස.ම එච්.ඒ. ගාමිණී සංජීව මැතිතුමා කළ යෝජනාව ගරු ප්‍රා.ස.ම. සිරිසේන හෙට්ටිගේ මැතිතුමාගේ ස්ථිරත්වයෙන් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 7- 4. ටෙන්ඩර් කමිටුව

- ගරු සභාපති අයි.ජී.මහින්ද මැතිතුමා සභාපති
- ගරු ප්‍රා.ස.ම.ගාමිණී ජයවික්‍රම මැතිතුමා සාමාජික
- ගරු ප්‍රා.ස.ම.ඒ.පී. නිශාන්ත කුමාර මැතිතුමා සාමාජික
- ගරු ප්‍රා.ස.ම.එන්.ඒ.එස්. වීරසිරි මැතිතුමිය සාමාජික
- ලේකම් - ඩබ්.කේ. සුරංග මහතා සාමාජික
- සැපයුම් විෂයභාර නිලධාරී සාමාජික
- තාක්ෂණ සේවා නිලධාරී සාමාජික
- ආදායම් පරීක්ෂක නිලධාරී සාමාජික

සුදුසු යැයි ගරු ප්‍රා.ස.ම කේ. ඒ ප්‍රේමතිලක මැතිතුමා කළ යෝජනාව ගරු ප්‍රා.ස.ම. යූ.ජී. ධර්මසිරි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 7- 5. පරිසර හා පහසුකම් කමිටුව

- ගරු උප සභාපති එම්.ජයන්ත මැතිතුමා සභාපති
- ගරු ප්‍රා.ස.ම.කේ.රන්ජන් වීරසේකර මැතිතුමා සාමාජික
- ගරු ප්‍රා.ස.ම.ඩබ්.ඒ. සංජීව මැතිතුමා සාමාජික
- ගරු ප්‍රා.ස.ම.එම්.ඩී.සුගතදාස මැතිතුමා සාමාජික
- ගරු ප්‍රා.ස.ම.ආරියරත්න ඒකනායක මැතිතුමා සාමාජික
- මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරී - 01 සාමාජික
- ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරී - 01 සාමාජික
- මිද්දෙනිය පුරාණ විහාරස්ථානයේ කන්ද කුඹුරේ සුදම්ම ස්වාමීන් වහන්සේ සාමාජික
- පරිසර විෂය නිලධාරී සාමාජික

සුදුසු යැයි ගරු ප්‍රා.ස.ම කේ. සුනිල් ශාන්ත කුමාර මැතිතුමා කළ යෝජනාව ගරු ප්‍රා.ස.ම. කේ. ඒ ප්‍රේමතිලක මැතිතුමාගේ ස්ථිරත්වයෙන් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 7- 6. තාක්ෂණික ඇගැයිම් කමිටුව

- ගරු ප්‍රා.ස.ම.අයි.කේ. සුසන්ත මැතිතුමා සභාපති
- ගරු ප්‍රා.ස.ම.එම්.පී.සී. කැලුම් තුෂාර ගරුසිංහ මැතිතුමා සාමාජික
- ගරු ප්‍රා.ස.ම.පී.එන්.එස්. ගුණවර්ධන මැතිතුමිය සාමාජික
- තාක්ෂණ සේවා නිලධාරී සාමාජික
- කටුවන ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ගණකාධිකාරී සාමාජික
- අදාළ ක්ෂේත්‍රයේ රාජ්‍ය සේවයේ නියුතු නිලධාරී 01 සාමාජික

සුදුසු යැයි ගරු ප්‍රා.ස.ම එච්.ඒ. ගාමිණී සංජීව මැතිතුමා කළ යෝජනාව ගරු ප්‍රා.ස.ම.මානෙල් දිසානායක මැතිතුමියගේ ස්ථිරත්වයෙන් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 7- 7. ආගමික සහජීවනය පිළිබඳ කමිටුව

- ගරු ප්‍රා.ස.ම.ඩබ්.එච්.ඒ. සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා  සභාපති
- ගරු ප්‍රා.ස.ම.එච්.ඒ. ගාමිණී සංජීව මැතිතුමා  සාමාජික
- ගරු ප්‍රා.ස.ම.එච්.ඒ ප්‍රදීපා නිසංසලා මැතිතුමිය  සාමාජික
- වැලිපිටිය විහාරස්ථානයේ වැලිපිටියේ උදිත ස්වාමීන් වහන්සේ  සාමාජික
- සංවර්ධන නිලධාරී - ඩබ්.එච්.ඒ. ඉන්දික මහතා  සාමාජික

සුදුසු යැයි ගරු ප්‍රා.ස.ම එච්.ඒ. ගාමිණී සංජීව මැතිතුමා කළ යෝජනාව ගරු ප්‍රා.ස.ම. ශාන්ත ජයලත් මැතිතුමාගේ ස්ථිරත්වයෙන් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

මෙම කමිටු පත් කිරීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

# 08 - යථා පරිදි කල් දී ඇති යෝජනා

## 08 – 1, කටුවන ලැබුන්ගමවත්ත දැව කැබලි කිරීමේ කර්මාන්තයට පරිසර බලපත්‍ර ලබා දීම.

**( ගරු සභාපති අයි.ජී.මහින්ද මැතිතුමා )**

කටුවන, ලැබුන්ගමවත්ත යන ස්ථානයේ කේ.හරිස්චන්ද්‍ර කුලරත්න මහතා විසින් 2017.10.16 දින අයදුම් කර, අනුමත කිරීමෙන් පසු දැව කුඩා කැබලි කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වා ගෙන යනු ලැබේ. මෙම කර්මාන්තය සඳහා සියළුම ආයතන කොන්දේසි සහිතව අනුමැතිය ලබා දී තිබුණි. නමුත් ලබා දුන් කොන්දේසි සපුරාලීමට අපොහොසත් වූ නිසා කර්මාන්තය තහනම් කිරීමට සිදු වී ඇත. නැවත එම කර්මාන්තය ආරම්භ කිරීම සඳහා ඒ මහතා විසින් කළ ඉල්ලීම අනුව වගකිව යුතු සියළු ආයතන කැඳවා 2018.03.18 දින ස්ථානීය පරීක්ෂණයක් සිදු කරන ලදි. එම ඒකාබද්ධ පරීක්ෂණය අනුව කටුවන පොලිස් ස්ථානය, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය, අඩවි වන කාර්යාලය, කටුවන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා මධ්‍යම පරිසර අධිකාරිය විසින් කර්මාන්තය පවත්වා ගෙන යාමට නම් අදාළ කොන්දේසි සපුරාලීම කළ යුතු බව දන්වා ඇත.

කර්මාන්තය සම්බන්ධයෙන් වගකිව යුතු ආයතන එවා ඇති කොන්දේසි ඉටු කර නොමැති නම් සභාවක් ලෙස අප ආයතනයටද බලපත්‍රය නිකුත් කළ නොහැක. එබැවින් පරිසර හා පහසුකම් කමිටුව විසින් අදාළ ආයතන විසින් ඉදිරිපත් කර ඇති කොන්දේසි සපුරා ඇත්දැයි යන්න සොයා බැලිය යුතු බවත්, එම කොන්දේසි සපුරා ඇති නම් කර්මාන්තය පවත්වා ගෙන යාමට අනුමැතිය ලබා දිය යුතු බව යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. සිරිසේන හෙට්ටිගේ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු ප්‍රා.ස.ම.එම්. සිරිසේන මැතිතුමා**

අපි මෙම කර්මාන්තය බලන්න ගියා. ලැබුන්ගමවත්ත ආශ්‍රිතව පරිසරය සුරැකීමේ සංවිධානයක් තියනවා. මේ සම්බන්ධව ජනාධිපතිතුමා දක්වා කරුණු ඉදිරිපත් කර තිබෙනවා. ආගමික ස්ථාන දැඩි සේ මේ කර්මාන්තයට විරුද්ධයි. හම්බන්තොට දිස්ත්‍රික්කයේ තෙත් කලාපය ආශ්‍රිතව තිබෙන සභාවක් කටුවන. එය අපි ලබපු දායාදයක්. කටුවන , ගොමඩිය, මැදකන්ද ආදී ප්‍රදේශ මෙන්ම සපුගහදොළ තෙත් කලාපීය පරිසරයකට හිමිකම් කියනවා. මේ කර්මාන්ත නිසා අපිට එම සම්පත් අහිමි වෙලා යනවා.

මෙම කර්මාන්ත ශාලාවේ දැනටත් මහා දැව කඳන් හයිඩ්‍රොලික් කියත්වලින් කපනවා. කර්මාන්ත බිම එවැනි දැව කඳන් තවමත් දකින්න ලැබෙනවා. කටුවන රබර් වගාව සීමිත ප්‍රමාණයක තිබෙනවා. ඒවා අවු. 18 යන තෙක් කපන්න බැහැ. මේ කර්මාන්තයට අනුව කපන්නේ කුමන වර්ගයේ ගස්ද යන්න ගැටළු මතු වෙනවා. කපන දැව වර්ගය පිළිබඳ විශේෂ අවධානය යොමු කළ යුතුයි. පාරසරික අතින් ඉතාම අහිතකරයි. මෙලෙස කැලෑ කැපීම නිසා රිලවුන්ගෙන්, දඬුලේනුන්ගෙන් භෝග වගාවන් සඳහා හානි පැමිණෙනවා. ගස් ටික කපා දැම්මම කටුවන කාන්තාරයක් බවට පත් වෙයි.

ප්‍රථමයෙන්ම කර්මාන්තයේ හිමිකරු අදාළ කොන්දේසි සපුරා තිබේද යන්න අනිවාර්යෙන් පරික්ෂා කළ යුතුයි. මේ නිර්දේශ ක්‍රියාත්මක නොකර බලපත්‍ර දුන්නොත් මොකද වෙන්නෙ? මේ කර්මාන්තය නිසා ඉදිරියේදී සිදු වන අහිතකර බලපෑම පිළිබඳ අපි අවධානය යොමු කර කටයුතු කරමු.

**<u>ගරු ප්‍රා.ස.ම.ආරියරත්න ඒකනායක මැතිතුමා</u>**

සභා බල ප්‍රදේශය තුළ කර්මාන්තයක් තියනවා කියන්නේ සභා බල ප්‍රදේශය දියුණු වෙනවා කියන එකයි. මීට පෙර කටුවන ගල් මෝල පැවති අවස්ථාවේ දැනට වඩා පාරසරික ගැටළු තිබුණා. ගල් මෝලක් පවත්වා ගෙන යනවාට වඩා මෙම කර්මාන්තයෙන් සිදු වන පාරසරික ගැටළු අඩුයි. ප්‍රදේශයේ ජනතාවට රැකියා අවස්ථා ලැබෙනවා. මීට වඩා දර ලොරි ප්‍රමාණයක් තේ කර්මාන්ත ශාලාවලට ගෙන යනවා. ඒවාටත් විරුද්ධ වෙන්න ඕන. එම නිසා අදාළ කොන්දේසි සපුරා තියේනම් මෙම කර්මාන්තය පවත්වා ගෙන යාමේ ගැටළුවක් නැහැ.

**<u>ගරු ප්‍රා.ස.ම. කේ. ඒ ප්‍රේමතිලක මැතිතුමා</u>**

ඒකනායක මන්ත්‍රීතුමාගේ අදහසට මම එකඟවෙනවා. මම කඩයේ සිටින වෙලාවක එක දිනකට දර ලොරි 24 ක් ගියා. මීට පෙර ගල් මෝලක් තිබුණා. ගල් මෝලේ ශබ්දය හා මෙම කර්මාන්තයේ ශබ්දය වෙනස්. කර්මාන්තය පිළිබඳ පුද්ගලික ආරවුලක් ඇති. නැත්නම් ගැටළුවක් නැහැ. වර්ෂයකට වරක් ගම්වල ගම්බිරිස් සඳහා සිටුවන මකුලත කපනවා. ඒවා මෙම කර්මාන්තයට යොමු කරන්න පුළුවන්. තේ කර්මාන්ත ශාලා සඳහා යන දර ලොරි නවත්වා මේ සඳහා යොමු කළ හැකියි. මේ කර්මාන්තය සඳහා ලබා දී ඇති කොන්දේසි සපුරා ඇත්නම් කර්මාන්තයට ඉඩක් දෙන්න. එය පවත්වා ගෙන යන්න අපි හරි සහයෝගයක් දෙමු.

**<u>ගරු ප්‍රා.ස.ම.කේ.එච්. චන්ද්‍රසේන මැතිතුමා</u>**

මේ මන්ත්‍රීතුමන්ලා කියන කතාව හරි. අපතේ යන දර ටික ගෙනත් සල්ලි ගන්න කතාව ඇත්ත. නොදැනුවත්ව ගස් කපලා ගේන එකත් ඇත්ත. පිටලෑලි විකුණලා සල්ලි ගන්න එකත් හරි. ඒ වාගේම කර්මාන්තය සඳහා දී ඇති කොන්දේසිවලටත් අපි එකඟයි. එක් එක් අංශ ආරක්ෂා කර ගන්න නීති අණපනත් තියනවා. මෙහිදී සාමය කඩ වෙනවා කියන එක නොවෙයි බලන්න ඕන. මේක පෞද්ගලික ප්‍රශ්නයක්. කටුවන ප්‍රදේශය ආශ්‍රිතව පරිසරය සුරැකීමේ සංවිධානයක් නැහැ. කර්මාන්තය සඳහා අවසර දෙන්න කියන්නෙත් නැහැ. එපා කියන්නෙත් නැහැ. මේ ගැටළුව සියළුම නිලධාරීන් එකතු වී සභාව කර පිට තියලා තියනවා. සොයා බලා අවශ්‍ය කටයුතු කරමු.

කර්මාන්තය සඳහා ඉදිරිපත් කර ඇති කොන්දේසි අනුව මේ ව්‍යාපාරය පවත්වා ගෙන යන්න බැහැ. දිනක් උදේ 5.00ට පමණ කටුවන නගරයට පැමිණියහොත් ප්‍රේමතිලක මන්ත්‍රීතුමා කිව්ව ප්‍රමාණයට වඩා දර ලොරි යනවා. මේ ප්‍රමාණය සීමා කරන්න බලමු. අපි සභාවක් ලෙස මාර්ග නඩත්තු කරනවා. මේ දර ලොරි ගිහින්ම මාර්ග අබලන් වෙලා. නමුත් ඒවායෙන් කිසිඳු ආදායමක් සභාවට නැහැ. මේ කර්මාන්තය නිසා සභාවට වර්ෂයකට රු.3000.00 ක ආදායමක් එනවා. අපි සභාවක් හැටියට පෙනී ඉන්න ඕන මේ කර්මාන්තය නවත්වන්න නොවේ. ඒවා පවත්වා ගෙන යන්න ඉඩ දෙන්න ඕන. කර්මාන්තය සම්බන්ධයෙන් පුද්ගලික ගැටළුත් තියනවා. ඒ වාගේම ලොකු දැව කඳන් ගෙන එනවා. ඒවා සීමා කරලා අදාළ ආයතන මඟින් ඉදිරිපත් කර ඇති කොන්දේසි අනුව අවශ්‍ය කටයුතු කරමු.

**ගරු ප්‍රා.ස.ම. ශාන්ත ජයලත් මැතිතුමා**

මේ ප්‍රදේශයේ ප්‍රශ්නයක් තවත් ප්‍රදේශයකට ගෙන යන්නේ නැතිව මේ අවස්ථාවේම විසඳ ගන්න බලන්න. එසේ නැති වුණොත් තවත් ප්‍රදේශයක මේ තත්ත්වයම ඇති වෙන්න පුළුවන්.

**ගරු සභාපති අයි.ජී.මහින්ද මැතිතුමා**

අපි පරිසර හා පහසුකම් කමිටුව සමඟ ස්ථානීය පරීක්ෂණයක් සිදු කර අදාළ ආයතන ඉදිරිපත් කර ඇති කොන්දේසි සපුරා ඇත්දැයි බලමු. එම කොන්දේසි සපුරා ඇත්නම් කර්මාන්තය සඳහා අවසර ලබා දෙමු. මේ කර්මාන්තය පිළිබඳ ස්ථානීය පරීක්ෂණයක් සිදු කර අදාළ වර්තාව ලබන සභා වාරයට ඉදිරිපත් කරන ලෙස යෝජනා කරමි.

එම යෝජනාව ගරු.ප්‍රා.ස.ම. කේ.ඒ. ප්‍රේමතිලක මැතිතුමා ස්ථිර කරන ලදි.

දැව කුඩා කැබලි කිරීමේ කර්මාන්තය පවත්වා ගෙන යාම සඳහා අදාළ ආයතන විසින් ලබා දී ඇති කොන්දේසි සපුරා ඇතිද කියා ස්ථානීය පරීක්ෂණයක් සිදු කර වාර්තාව ලබන සභා වාරයට ඉදිරිපත් කිරීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 8 -2. බටුමුල්ල මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම.

### ( ගරු ප්‍රා.ස.ම.ඒ.පී. නිශාන්ත කුමාර මැතිතුමා )

කටුවන සියඹලාමුරය කොට්ඨාසයේ බටුමුල්ල මාර්ගය ඉතා අබලන් තත්ත්වයට පත් වී ඇත. බොහෝ පිරිසක් මේ වන විට එම මාර්ගය භාවිතා කරයි. සියාරපිටිය මහා විද්‍යාලයට විශාලා දරුවන් ප්‍රමාණයක් ගමන් කරන්නේ ද මේ මාර්ගයෙනි. මේ මාර්ගය හරහා පවතින ඇළට පාලමක් නොමැති නිසා වැසි කාලයට දරුවන්ට පාසල් යාමටද අපහසුය. එම නිසා කිලෝමීටරයක් පමණ තිබෙන මේ මාර්ගය ප්‍රතිසංස්කරණය කරන ලෙස යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම.ශාන්ත ජයලත් මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු ප්‍රා.ස.ම.කේ.එච්. චන්ද්‍රසේන මැතිතුමා**

එම මාර්ගයේ යන්න බැහැ. කාලෙකින් ප්‍රතිසංස්කරණය කරලා නැහැ. කොට්ඨාසය ඇතුලෙත් මෙවැනි ස්ථාන තියනවා. ඇතැම් ස්ථානවලට පාලම් දාන්න ඕන. බල ප්‍රදේශයේ ගමන් කිරීමට අපහසු සියළුම මාර්ග සකස් කළ යුතුයි. කොට්ඨාස 17 තුළ ප්‍රථමයෙන් සකස් කළ යුතු මාර්ග ලේඛනයක් මන්ත්‍රීවරුන්ගෙන් ලබා ගන්න. එම ලබා ගන්නා ලද මාර්ග ලේඛනයට ඇස්තමේන්තු සකස් කරන්න. ඉන් පසුව බැකෝ යන්ත්‍රය, මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය හා රෝලර් යොදා මාර්ග සකස් කරන්න. ඉදිරි මාස දෙක තුළ සෑම කොට්ඨාසයකම මාර්ග හදමු.

අතීතයේ ප්‍රාදේශීය සභා මාර්ග සංවර්ධනය යනුවෙන් බල ප්‍රදේශයේ ශ්‍රමදානයක් කළා. ඒ කාලේ සම්පත් නැහැ. නමුත් දැන් අපිට සම්පත් තියනවා. දැන් තියෙන්නෙ ඒවා හරි විදියට මෙහෙයවන්න විතරයි. පුළුවන් තරම් හැම පැත්තක්ම ආවරණය වන පදිරි මාර්ග සකස් කරමු. හැම පාරක්ම ඇස්තමේන්තු කරන්න ඕන. හැම පාරකටම වටිනාකමක් තියෙන්න ඕන. අපි සංවර්ධන කටයුතුවලදී සභාවේ සම්පත් හා සේවකයින් යොදවනවා. නමුත් අපි ඒ වෙනුවෙන් ඇස්තමේන්තු සකස් කරන්නෙ නැහැ. ඒ නිසා අළුත්වැඩියා කිරීමට යෝජිත මාර්ග සඳහා ඇස්තමේන්තු සකස් කරන්න. කර්මාන්ත කමිටුවක් තියනවා. ඔවුන්ට මේවා අධීක්ෂණය කරන්න පුළුවන්. කොට්ඨාස නියෝජනය කරන ඇතැම් මන්ත්‍රීවරු තම කොට්ඨසයේ තිබෙන සමහර මාර්ග පිළිබඳව දන්නෙත් නැතිව ඇති. එම නිසා තම කොට්ඨාසයට අදාළ මාර්ග ලේඛනයක් ලබා ගෙන මාර්ග ප්‍රතිසංස්කරණය කරමු.

**ගරු සභාපති අයි.ජී.මහින්ද මැතිතුමා**

බල ප්‍රදේශයේ කොට්ඨාස 17 ක් තියනවා. එම කොට්ඨස 17 ට නියෝජිතයින් 17 ක් සිටින අතර, ඊට අමතරව විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා සිටිනවා. පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු සියළු දෙනා සාකච්ඡා

කර තම කොට්ඨාසයේ සකස් කළ යුතු මාර්ග ලේඛනයක් ලබා දෙන්න. අපි ඒවා සහා අරමුදලින් ප්‍රතිසංස්කරණය කරමු. ඒ වාගේම බටුමුල්ල මාර්ගයත් අපි තක්ෂණික නිලධාරී හරහා ඇස්තමේන්තු සකස් කර ප්‍රතිසංස්කරණය කර දෙන්නම්.

සියාරපිටිය බටුමුල්ල මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සහා සම්මත විය.

## 08 – 3. වීදපොල ගොම්බද්දලහේන මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම.

**( ගරු ප්‍රා.ස.ම.සිරිසේන හෙට්ටිගේ මැතිතුමා )**

දෙහිගහහේන ග්‍රාම නිලධාරී වසමේ ගොම්බද්දලහේන මාර්ගයේ ගමන් කිරීමට ඉතාම අපහසුය. එබැවින් බැකෝ යන්ත්‍රය යොදා එම මාර්ගය ප්‍රතිසංස්කරණය කර දෙන ලෙස යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම.කේ. ඒ. ප්‍රේමතිලක මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු සභාපති අයි.ජී.මහින්ද මැතිතුමා**

අපි එම මාර්ගය තක්ෂණික නිලධාරී හරහා ඇස්තමේන්තු සකස් කර බැකෝ යන්ත්‍රය යොදා ප්‍රතිසංස්කරණය කර දෙන්නම්.

වීදපොල ගොම්බද්දලහේන මාර්ගය සහා අරමුදල් යොදවා ප්‍රතිසංස්කරණය කිරීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සහා සම්මත විය.

## 08 – 4 . තලපත්කන්ද උඩ අම්බලම මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම.

**( ගරු ප්‍රා.ස.ම.සිරිසේන හෙට්ටිගේ මැතිතුමා )**

තලපත්කන්ද උඩ අම්බලම මාර්ගය බොහෝ කාලයකින් ප්‍රතිසංස්කරණ කර නොමැති නිසා ජනතාවට ගමන් කිරීමට අපහසු තත්ත්වයේ පවතී. එම නිසා මෙම මාර්ගය පිළිසකර කර දෙන ලෙස යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම.එච්.ඒ. ගාමිණී සංජීව මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු සභාපති අයි.ජී.මහින්ද මැතිතුමා**

අපි එම මාර්ග තක්ෂණික නිලධාරී හරහා ඇස්තමේන්තු සකස් කර බැකෝ යන්ත්‍රයක් යොදා ප්‍රතිසංස්කරණය කර දෙන්නම්.

තලපත්කන්ද උඩ අම්බලම මාර්ගය ප්‍රතිසංස්කරණය කර දීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සහා සම්මත විය.

## 08 – 5 . දෙහිගහහේන කොට්ඨාසයේ අක්‍රිය වී ඇති වීථි ලාම්පු සවි කිරීම

**( ගරු ප්‍රා.ස.ම.සිරිසේන හෙට්ටිගේ මැතිතුමා )**

දෙහිගහහේන කොට්ඨාසයේ වීථි ලාම්පු අත්‍යාවශ්‍යම ස්ථාන 05 ක් පමණ තියනවා. ඒවායේ ඇති වීථි ලාම්පු අක්‍රිය වෙලා. එම විථි ලාම්පු ප්‍රතිසංස්කරණය කර දෙන්න කියා යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම.යූ.ජී.ධර්මසිරි මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු සභාපති අයි.ජී.මහින්ද මැතිතුමා**

අපි ප්‍රතිපාදන තිබෙන විදියට වීථි ලාම්පු ප්‍රතිසංස්කරණය කර දෙන්නම්. බල ප්‍රදේශයේම වීථි ලාම්පු ප්‍රතිසංස්කරණය කර දෙනවා. එමෙන්ම මන්ත්‍රීතුමන්ලාගේ නිවෙස් ළඟට දාන්න වීථි ලාම්පුවක් දෙනවා. අලුතින් වීථි ලාම්පු සවි කිරීමත් සිදු කරනවා.

දෙහිගහහේන කොට්ඨාසයේ අක්‍රිය වී ඇති වීථි ලාම්පු සවි කිරීම හා බල ප්‍රදේශයේම වීථි ලාම්පු ප්‍රතිසංස්කරණය කිරීම මෙන්ම අලුතින් වීථි ලාම්පු සවි කිරීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 8 – 6 . වායු රයිෆල් ලබා ගැනීම

**( ගරු ප්‍රා.ස.ම.සුගත් සරඹගේ මැතිතුමා )**

කටුවන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් රදනිආර, නැමනැලිය, උඩහගොඩ, වීදිකන්ද ආදී ග්‍රාම නිලධාරී වසම්වල ජීවත් වන ජනතාවගේ ආර්ථිකයට විශාල වශයෙන් බලපාන ගැටළුවක් දඬු ලේනුන්ගෙන් හා රිලවුන්ගෙන් සිදු වෙනවා. මාපිටකන්ද තිබූ කැලෑව 1970 හා 1977 ආණ්ඩු විසින් කපා දමා ෆයිනස් සිටුවා තිබෙනවා. ඒ නිසා සත්ත්වයින්ගේ වාසස්ථාන අහිමි වී ගියා. එම කැලෑවල සිටි වන සතුන් ගම්මානවලට ආවා. දැන් ඒ නිසා මිනිසුන්ට තම වගාවන් ආරක්ෂා කළ නොහැකි තත්ත්වයට පත් වී තිබෙනවා. පොල් අක්කර 03, 04, 05 තිබුණ ජනතාව දැන් කඩෙන් පොල් ගෙනත් කනවා. ඒ තරමට මේ සත්ත්වයින්ගෙන් හානි සිදු වෙනවා. ඒ වාගේම මිනිසුන්ට වෙනත් වගාවක් කළ නොහැකි තත්ත්වයටද පත් වී තිබෙනවා. එම නිසා මෙම සත්ත්වයින් එළවා දැමීම සඳහා වායුරයිෆල් ලබා දෙන ලෙස යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම.ආරියරත්න ඒකනායක මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි. අදාළ ආයතන දැනුවත් කර ෆයිනස් ඉවත් කර ඒ වෙනුවට පළතුරු ගස් වවන්න කියන්න.

**ගරු සභාපති අයි.ජී.මහින්ද මැතිතුමා**

දැන් ඉස්සර වගේ වායු රයිෆල් අපිට ලබා ගන්න බැහැ. ආරක්ෂක අමාත්‍යාංශයෙන් ඒ සඳහා අවසර ලබා ගන්න ඕන. එම නිසා වායු රයිෆල් ලබා ගැනීමට ආරක්ෂක අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් කර අනුමැතිය ලැබුණු පසු ඒවා ලබා ගන්න.

වායු රයිෆල් ලබා ගැනීම සඳහා අරක්ෂක අමාත්‍යාංශ අනුමැතිය ගැනීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 8 -7 . රදනිආර - නමනැලිය - උඩහගොඩ - වීදිකන්ද මාර්ගය මෝටර් ග්‍රේඩර් කිරීම.

**( ගරු ප්‍රා.ස.ම.සුගත් සරඹගේ මැතිතුමා )**

රදනිආර - නමනැලිය - උඩහගොඩ - වීදිකන්ද මාර්ගය ජනතාවට ගමන් කිරීමට අපහසු තත්ත්වයේ පවතින බැවින් කඩිනමින් එම මාර්ගය ප්‍රතිසංස්කරණය කර දෙන ලෙස යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම.ඒ.පී. නිශාන්ත කුමාර මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු සභාපති අයි.ජී.මහින්ද මැතිතුමා**

අපි එම මාර්ග තාක්ෂණික නිලධාරී හරහා ස්ථානීය පරීක්ෂණයක් සිදු කර, ඇස්තමේන්තු සකස් කිරීමෙන් පසු ප්‍රතිසංස්කරණය කර දෙන්නම්.

රදනිආර - නමනැලිය - උඩහගොඩ - වීදිකන්ද මාර්ගය ප්‍රතිසංස්කරණය කර දීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 8 – 8 . බූකැන්දයාය අම්බලමගාහේන  පොදු සුසාන භූමිය නිරවුල් කර ගැනීම

**( ගරු ප්‍රා.ස.ම.කේ.ජ්. ප්‍රේමතිලක මැතිතුමා )**

බූකැන්දයාය ග්‍රාම නිලධාරී වසමේ පොදු සුසාන භූමිය සඳහා වෙන් කර ඇති අම්බලමගාහේන නැමැති ඉඩම පුද්ගලයකු විසින් අනවසරයෙන් අත් කර ගෙන ඇත. මෙම ඉඩම සභාවට පවරා ගන්න 2006 ගමගේ සභාපතිතුමාගේ කාලයේ සිට උත්සාහ කළා. නමුත් එය බැරි වුණා. බූකැන්දයාය රතුගල මළ ගෙයක් වුණා. ඔවුන්ට දේහය මිහිදන් කරන්න ප්‍රමාණවත් ඉඩමක් තිබුණේ නැහැ. තව දේහයක් අපේ තාත්තාගේ සෙහොන ළඟින් මිහිදන් කරන්න කියලා මම කිව්වා. ජනතාවට ප්‍රමාණවත් ඉඩම් නොමැති විට සුසාන භූමියක  අවශ්‍යතාවය තදින්ම දැනෙනවා. එම නිසා මෙම සුසාන භූමිය නිරවුල් කර දෙන ලෙස යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම.යූ.ජී.ධර්මසිරි මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි. සභාවට අයත් සුසානභූමි ඉඩම් පවරා ගන්න කටයුතු කරන්න.

<u>ගරු ප්‍රා.ස.ම.ආරියරත්න ඒකනායක මැතිතුමා</u>

බල ප්‍රදේශයේ කොට්ඨාස 17 තුළම සුසානභූමි තියනවා. ගොඩක් අය අනවසරයෙන් අල්ලාගෙන තියනවා. එම නිසා එක කොට්ඨාසයකට එක සුසාන භූමියක්වත් පවරා ගන්න.

<u>ගරු ප්‍රා.ස.ම.ජේ.චන්ද්‍රලතා මැතිතුමිය</u>

එම සුසානභූමිය මගේ සියාගේ ඉඩමක්. එම ඉඩම රජයට ලියලා දීලා නැහැ. ප්‍රාදේශිය ලේකම් භාරයේ තියනවා. අපිත් අපේ ආච්චිට, සියට පිංසිද්ධ වෙන්න ඒ ඉඩම සුසාන භූමියකට දෙන්න කැමැතියි.

<u>ගරු ප්‍රා.ස.ම.කේ.ජ්. ප්‍රේමතිලක මැතිතුමා</u>

මේ මාසය තුළ මෙම ඉඩම ගන්න පුළුවන්නම් හොඳයි. මේ ඉඩම බදු දීලා තියනවා. දැන් අනවසරකරුවන් එය අයිති කරගෙන තිබෙනවා. මේ ඉඩම් නිදහස් කර නොගන්නේ නම් ඉදිරියට මට මළ ගෙදරකටවත් යන්න බැරි වෙනවා. මේ ඉඩම පවරා ගෙන මොකක් හරි ව්‍යාපෘතියක් කරමු. එහෙම වුණොත් කාටවත් අල්ලා ගන්න බැහැ. ඒ ඉඩම පුද්ගලික ඉඩමක් කියලා ඔප්පු කරනවනම් මට මගේ තාත්තා ලියලා දී තිබෙන අක්කරයක ඉඩමෙන් අක්කර භාගයක් සුසාන භූමියට ලබා දෙනවා. මෙම සුසාන භූමි ඉඩම වාගේම හැඩිවත්ත ආදාහනාගර ඉඩමත් පවරා ගන්න ඕන. ආදාහනාගාරයේ වැඩ ආරම්භ කරන්න.

<u>ගරු ප්‍රා.ස.ම.කේ.එච්. චන්ද්‍රසේන මැතිතුමා</u>

මෙම ඉඩම් 1986 මැනලා තියනවා. එහිදී සුසානභූමි හා පොදු කටයුතු වෙනුවන් ඉඩම් වෙන් කර තිබෙනවා. ඒ නිසා මේ ඉඩම්  පිළිබඳ තොරතුරු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගන්න.

<u>ගරු සභාපති අයි.ජී.මහින්ද මැතිතුමා</u>

අපි මේ සුසානභූමි ඉඩම සභාවට පවරා දෙන්න කියා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ඉල්ලීමක් කරමු. ඒ වාගේම හැඩිවත්ත ආදාහනාගාරයේ වැඩ අවසන්. ඉදිරියට අලංකරණ කටයුතු හා ආරක්ෂිත වැට සකස් කරන්න ඕන. නමුත් එහි සේවය සඳහා මුරකරුවන් තිදෙනෙක් හා ආදාහනාගාර ක්‍රියාකරුවෙකු බඳවා ගන්න වෙනවා. එම අඩුපාඩු සකස් කර ගත් පසු විවෘත කරන්න පුළුවන්. ඒ වාගේම මෙම ඉඩමත් පවරා ගන්න ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් ඉල්ලීමක් කරමු.

බූකැන්දයාය පොදු සුසානභූමි ඉඩම සභාවට පවරා දෙන ලෙස කටුවන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ඉල්ලීම් කිරීම් සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08 – 9 . මිද්දෙනිය නගරය ආශ්‍රිතව වීථි ලාම්පු සවි කිරීම

**( ගරු ප්‍රා.ස.ම. ගාමිණී ජයවික්‍රම මැතිතුමා )**

මිද්දෙනිය නගරයේ පහත සඳහන් ස්ථානවලට සවි කිරීම සඳහා වීථි ලාම්පු අවශ්‍ය වී තිබෙනවා. එම නිසා මෙම ස්ථානවලට අවශ්‍ය වීථි ලාම්පු ලබා දෙන ලෙස යෝජනා කරමි.

- මුරුංගස්යාය හංදිය අසල සවි කිරීම සඳහා
- මිද්දෙනිය පනාමුර පාර තුන්වන පටුමග ජල පොම්පාගාරය අසල සවි කිරීම සඳහා
- මිද්දෙනිය වැව රවුම්පාර බිබුල අසල සවි කිරීම සඳහා
- මිද්දෙනිය සමූහ ගොවිපොළ පොම්පාගාරය අසල සවි කිරීම සඳහා
- මිද්දෙනිය නැගෙනහිර සේවා පියස අසල සවි කිරීම සඳහා
- මිද්දෙනිය නැගෙනහිර අටවන පටුමග හංදිය අසල සවි කිරීම සඳහා
- මිද්දෙනිය මහා විද්‍යාලය අසල සවි කිරීම සඳහා
- මිද්දෙනිය තෙක්ක වත්ත ජල ටැංකිය අසල සවි කිරීම සඳහා
- මිද්දෙනිය ප්‍රාථමික විද්‍යාලය අසල සවි කිරීම සඳහා
- මිද්දෙනිය නුගේ ළඟ පෙර පාසල අසල සවි කිරීම සඳහා

ගරු ප්‍රා.ස.ම.ඩබ්.එච්.ඒ. සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

අපි ප්‍රතිපාදන ලැබෙන විදියට අදාළ ස්ථානවලට වීථි ලාම්පු සවි කරමු. බල ප්‍රදේශයේ වීථි ලාම්පු සවි කළ යුතු ස්ථාන විශාල ප්‍රමාණයක් තියනවා.

මිද්දෙනිය නගරයේ හා අනෙකුත් සඳහන් කරන ලද ස්ථානවලට වීථි ලාම්පු සවි කිරීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08 – 10 . වැලිපිටිය රත්න පෙර පාසල සඳහා ජලය ලබා ගැනීම.

**( ගරු ප්‍රා.ස.ම.කේ.සුනිල් ශාන්ත කුමාර මැතිතුමා )**

වැලිපිටිය ග්‍රාම නිලධාරී වසමේ පවත්වා ගෙන යන රත්න පෙර පාසල සඳහා ජල පහසුකම් නොමැත. දරුවන්ගේ අවශ්‍යතා සඳහා අසල්වැසි නිවෙස්වලින් ජලය ලබා ගනී. දුප්පත් දරුවන් බොහෝ ප්‍රමාණයක් මෙම පෙර පාසලෙහි අධ්‍යාපනය හදාරනු ලැබේ. ඒ ප්‍රදේශයට සභාවේ ජල ව්‍යාපෘතියෙන් ජලය ලබා දෙන බැවින් මෙම පෙර පාසල සඳහා ද ජලය ලබා දෙන මෙන් යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම.එච්.ඒ. ගාමිණී සංජීව මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු ප්‍රා.ස.ම.යූ.ජී.ධර්මසිරි මැතිතුමා**

එම පෙර පාසල පෞද්ගලික පෙර පාසලක්. එහි ආදායම ගන්නෙ කවුද ? ඔවුන්ට ලබා ගන්න ආදායමෙන් වතුර ලබා ගන්න පුළුවන්.

**ගරු ප්‍රා.ස.ම.කේ.සුනිල් ශාන්ත කුමාර මැතිතුමා**

එම පෙර පාසල සභාවට පවරා ගත්ත නම් ජලය ලබා දීමේ ගැටළුවක් නැහැ. සභාවේ පෙර පාසලක් තියනවනම් ගොඩක් වටිනවා. දරුවන් බොහෝ ප්‍රමාණයක් එනවා.

**<u>ගරු සභාපති අයි.ජී.මහින්ද මැතිතුමා</u>**

සභාවෙන් ජල සම්බන්ධතාවක් ලබා දෙන්න රු 19000.00 ට වැඩි මුදල් බඳින්න ඕන. එම නිසා මේ සඳහා අපි වෙන ප්‍රතිපාදනයක් ලබා ගන්න බලමු. මන්ත්‍රී ප්‍රතිපාදන ලැබෙන විට ගන්න පුළුවන් වෙයි. සභාවට පෙර පාසල් පවරා ගන්න බැහැ. දැන් පෙර පාසල්වල අයිතිය තියෙන්නේ අධ්‍යාපන අමාත්‍යංශයට. අපිට පෙර පාසල් ආරම්භ කරන්න දෙන්නෙ නැහැ.

රත්න පෙර පාසල සඳහා වෙනත් ප්‍රතිපාදනයක් වෙන් කර ගෙන ජලය ලබා දීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>8 – 11 . සියාරපිටිය කොට්ඨාසයේ වීථි ලාම්පු සවි කිරීම</u>

**( ගරු ප්‍රා.ස.ම.ඒ.පී. නිශාන්ත කුමාර මැතිතුමා )**

සියාරපිටිය කොට්ඨාසයේ ජනතාව වැඩි වශයෙන් භාවිතා කරන හා ගැවසෙන ස්ථාන බෙහෝමයක් රාත්‍රී කාලයේදී අනාරක්ෂිත තත්ත්වයට පත්ව ඇත. ප්‍රධාන මංසන්ධි, ප්‍රසිද්ධ ස්ථාන ඒ අතර වේ. එහිදී මහජනතාවගේ ආරක්ෂාව හා පහසුව සඳහා සියාරපිටිය කොට්ඨාසයට වීථි ලාම්පු සවි කර දෙන ලෙස යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම.සිරිසේන හෙට්ටිගේ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**<u>ගරු සභාපති අයි.ජී.මහින්ද මැතිතුමා</u>**

අපි සෑම මන්ත්‍රීතුමෙකුටම සවි කරන්න වීථි ලාම්පු දෙනවා. ප්‍රතිපාදන තිබෙන විදියට වීථි ලාම්පු සවි කරමු.

සියාරපිටිය කොට්ඨාසයේ වීථි ලාම්පු සවි කිරීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>8 – 12 . වරාපිටිය 14 කලාපය තුළ අක්‍රිය වී ඇති වීථි ලාම්පු නවීකරණය කිරීම</u>

**( ගරු ප්‍රා.ස.ම.ශාන්ත ජයලත් මැතිතුමා )**

වරාපිටිය 14 කලාපය තුළ සවි කර ඇති වීථි ලාම්පු මේ වන විට අක්‍රිය වී ඇති බැවින් ඒ ස්ථාන සඳහා වීථි ලාම්පු සවි කර දෙන ලෙස යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම.ඒ.පී. නිශාන්ත කුමාර මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**<u>ගරු සභාපති අයි.ජී.මහින්ද මැතිතුමා</u>**

අපි ප්‍රතිපාදන තිබෙන විදියට මන්ත්‍රීතුමන්ලාට වීථි ලාම්පු ලබා දෙනවා. ඒ වාගේම අලුතින් වීථි ලාම්පු සවි කිරීමට හා තිබෙන වීථි ලාම්පු ප්‍රතිසංස්කරණය සඳහා අලුතින් විදුලි උපකරණ ලබා ගත යුතු යැයි යෝජනා කරමි. එම භාණ්ඩ ලබාගත් විගස අක්‍රීය වී ඇති වීථි ලාම්පු නවීකරණය කර දෙනවා.

ගරු ප්‍රා.ස.ම.ශාන්ත ජයලත් මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි. කඩිනමින් විදුලි උපකරණ මිලදී ගන්න.

වරාපිටිය 14 කලාපය තුළ අක්‍රිය වී ඇති වීථි ලාම්පු නවීකරණය කිරීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>8 – 13 . වරාපිටිය 14 කලාපයේ ගම්මාන තුළ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම.</u>

**( ගරු ප්‍රා.ස.ම.ශාන්ත ජයලත් මැතිතුමා )**

වරාපිටිය කලාපය තුළ ගම්මාන මට්ටමින් ප්‍රතිසංස්කරණය නොවූ මාර්ග බොහෝ ප්‍රමාණයක් තියනවා. එම මාර්ග මෝටර් ග්‍රේඩර් කර දෙන ලෙස යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම.සිරිසේන හෙට්ටිගේ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු සභාපති අයි.ජී.මහින්ද මැතිතුමා**

අපි අත්‍යවශ්‍යම මාර්ග ප්‍රථමයෙන් ප්‍රතිසංස්කරණය කරමු. ප්‍රතිසංස්කරණය කළ යුතු මාර්ග ලේඛනය ලබා දුන් පසු ඇස්තමේන්තු සකස් කර මෝටර් ග්‍රේඩර් කර දෙන්නම්.

වරාපිටිය 14 කලාපය තුළ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 8 – 14 . රිටිගහයාය කොට්ඨාසයේ වීථි ලාම්පු සවි කිරීම.

**( ගරු ප්‍රා.ස.ම.මානෙල් දිසානායක මැතිතුමිය )**

රිටිගහයාය කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී වසම් 05 ක් ආවරණය වන පරිදි අත්‍යවශ්‍ය සියළු ස්ථානවලට වීථි ලාම්පු සවි කරන ලෙස යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම.එච්.ජී. ගාමිණී සංජීව මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු සභාපති අයි.ජී.මහින්ද මැතිතුමා**

අපි ප්‍රතිපාදන තිබෙන විදියට වීථි ලාම්පු ප්‍රතිසංස්කරණය කර දෙන්නම්. කොට්ඨාස 17 හිම වීථි ලාම්පු ප්‍රතිසංස්කරණය කරන්න ඕන.

රිටිගහයාය කොට්ඨාසයේ අක්‍රිය වී ඇති වීථි ලාම්පු සවි කිරීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08 – 15. බටගස්ස ඇළ ඉවුර පහළවත්ත මාර්ගයේ බටගස්ස ආරම්භක ස්ථානයේ සිලින්ඩර් යොදා සපත්තු බෝක්කුවක් සකස් කිරීම.

**( ගරු ප්‍රා.ස.ම.අයි.කේ. සුසන්ත මැතිතුමා )**

බටගස්ස ඇළ ඉවුර පහළවත්ත මාර්ගය බටගස්සෙන් පටන්ගන්නා ස්ථානයේ ඇති බෝක්කුව සිලින්ඩර් යොදා සපත්තු බෝක්කුවක් ආකාරයෙන් සකස් කර දෙන මෙන් යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම.ශාන්ත ජයලත් මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු සභාපති අයි.ජී.මහින්ද මැතිතුමා**

තාක්ෂණික නිලධාරී අදාළ ස්ථාන පරීක්ෂා කර ඇස්තමේන්තු සකස් කර පසු බෝක්කුව සකස් කරමු. සභා අරමුදලින් සකස් කරන්න බැරිනම් වෙන ප්‍රතිපාදනයක් හෝ වෙන් කර ගන්න බලමු.

බටගස්ස ඇළ ඉවුර පහළවත්ත මාර්ගය බටගස්සෙන් පටන්ගන්නා ස්ථානයේ ඇති බෝක්කුව සිලින්ඩර් යොදා සපත්තු බෝක්කුවක් සකස් කිරීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08 – 16 . මැදගම්ගොඩ වත්තෙහේන්ගොඩ ප්‍රධාන මාර්ගයේ කැඩී ගිය කොටස් ප්‍රතිසංස්කරණය කිරීම.

**( ගරු ප්‍රා.ස.ම. රමනි හල්පෙ ගමගේ මැතිතුමිය )**

හොරේවෙල කොට්ඨාසයේ මැදගම්ගොඩ, වත්තෙහේන්ගොඩ ප්‍රධාන මාර්ගයේ කැඩී ගිය කොටස් තිබෙනවා. ඒ නිසා ගමනාගමනය බොහෝම අපහසුයි. එම නිසා මෙම කැඩී ගිය කොටස් ප්‍රතිසංස්කරණය කරන ලෙස යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම.අයි.කේ. සුසන්ත මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

අපි එම මාර්ග තක්ෂණික නිලධාරී හරහා ස්ථානීය පරීක්ෂණයක් සිදු කර, ඇස්තමේන්තු සකස් කිරීමෙන් පසු ප්‍රතිසංස්කරණය කර දෙන්නම්.

මැදගම්ගොඩ, වත්තෙහේන්ගොඩ ප්‍රධාන මාර්ගයේ කැඩී ගිය කොටස් ප්‍රතිසංස්කරණය කිරීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 09. ගෙවීම් හා බැංකු සැකසුම් වාර්තා හා ප්‍රා.ස. 14,16 – 2018 මාර්තු මස

**( ගරු සභාපති අයි.ජී.මහින්ද මැතිතුමා )**

සභාව මගින් පවත්වාගෙන යන පහත සඳහන් බැංකු ගිණුම් හා ප්‍රා.ස. 14, 16 ඒකාබද්ධ වැය සාරාංශය හා ප්‍රා.ස - 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සභා සම්මත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

01 – 0077187171 - මෙහෙයුම් හා නඩත්තු ගිණුම

02 – 265 – 1 – 001-7-7876593 - ජල ව්‍යාපෘති ගිණුම

03 – 265-1-001-3-0020439 - සේවක ණය ගිණුම

04 – 265-1-001-2-7876595 - පොළ ව්‍යාපෘති ගිණුම

05 – 265-001-9-7876587 - පොදු අරමුදල් ගිණුම

06 – 0072633606 - කර්මාන්ත ගිණුම

07 - ප්‍රා.ස 14 - ඒකාබද්ධ වැය සාරාංශය

08 - ප්‍රා.ස 16 - ඒකාබද්ධ ලැබීම් සාරාංශය

ගරු ප්‍රා.ස.ම. කේ.ඒ.ප්‍රේමතිලක මැතිතුමාගේ ස්ථිරත්වයෙන් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 9. වෙනත් යෝජනා

## 10 – 1. කටුවන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ඉඩම් දීර්ඝ කාලීන බදු ක්‍රමය යටතේ ලබා දීම.

**( ගරු සභාපති අයි.ජී.මහින්ද මැතිතුමා )**

DSK /LND/TAX/L.TAX /FI /01 කටුවන ප්‍රාදේශීය ලේකම්ගේ අංක දරණ 2018.04.04 දිනැති ලිපි මගින් කටුවන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් අ.ග.පි 401 දඹේතලාව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි පහත සඳහන් ඉඩම්, අ.ග.පි. 391 වැලිපිටිය බටහිර ග්‍රා.නි.ව පිහිටි පහත සඳහන් ඉඩම් හා අ.ග.පි 140 ආරබොඩ ග්‍රාම නිලධාරී වසමේ පිහිටි පහත සඳහන් ඉඩම් මෙන්ම අ.ග.පි 152 වල්ගම්මුල්ල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි පහත සඳහන් ඉඩම් දීර්ඝ කාලීන ක්‍රමය යටතේ අදාල අයට ලබා දීමට එකඟතාවය ඉල්ලා ඇත. මෙම ඉඩම් පිළිබඳ පරික්ෂා කර වාර්තාවක් ලබා ගෙන අදාළ අයට ලබා දීමට එකඟතාවය ලබා දීම සුදුසු යැයි යෝජනා කරමි.

**අ.ග.පි 401 දඹේතලාව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි දීර්ඝකාලීන බදු ක්‍රමය යටතේ ලබා දිය යුතු ඉඩම්.**

| අනු අංකය | සම්පූර්ණ නම සහ ලිපිනය | වසම | කැබැලි අංකය | ප්‍රමාණය |
|---|---|---|---|---|
| 01 | වික්‍රමාච්චි අබේසිං කංකානම්ගේ අමරසිරි මයා, සැනසුම, මුරුංගස්යාය - නැ, මිද්දෙනිය | දඹේතලාව | කැ.අ. 760 න් කොටසක් | හෙ.0.594 |
| 02 | වික්‍රමාච්චි අබේසිං කංකානම්ගේ අමරසිරි මයා, සැනසුම, මුරුංගස්යාය - නැ, මිද්දෙනිය | දඹේතලාව | කැ.අ. 719 | හෙ.0.660 |
| 03 | වික්‍රමාච්චි අබේසිං කංකානම්ගේ සුරවීර මයා, කටුවන පාර, මිද්දෙනිය | දඹේතලාව | කැ.අ. 705 | හෙ. 314 |
| 04 | ජගත් කරණායක මයා, 31/3, සපුගහයාය, මිද්දෙනිය | දඹේතලාව | කැ.අ. 760 න් කොටසක් | හෙ. 100 |
| 05 | ජගත් කරණායක මයා, 31/3, සපුගහයාය, මිද්දෙනිය | දඹේතලාව | කැ.අ. 759 න් කොටසක් | හෙ. 100 |

**අ.ග.පි 391 වැලිපිටිය - බටහිර ග්‍රාම නිලධාරී වසමේ පිහිටි දීර්ඝකාලීන බදු ක්‍රමය යටතේ ලබා දිය යුතු ඉඩම්.**

| අනු අංකය | සම්පූර්ණ නම සහ ලිපිනය | වසම | කැබැලි අංකය | ප්‍රමාණය |
|---|---|---|---|---|
| 01 | එච්.ඒ.එම්. රේණුකා මිය, 131/5, හඳුගල නිවස, වැලිපිටිය, මිද්දෙනිය | වැලිපිටිය - බටහිර | - | පර්.30 |
| 02 | විදාන පතිරණගේ රූපසේන මයා, නාරංදෙනිය ගෙදර, වැලිපිටිය, මිද්දෙනිය | වැලිපිටිය - බටහිර | - | අක්.01 රූ: 02 |
| 03 | සුජාතා අයිරාංගනී කෝරලගේ මිය, නාරංදෙනිය ගෙදර, වැලිපිටිය, මිද්දෙනිය | වැලිපිටිය - බටහිර | - | අක්.01 රූ: 02 |

**අ.ග.පි 140 ආරබොඩ ග්‍රාම නිලධාරී වසමේ පිහිටි දීර්ඝකාලීන බදු ක්‍රමය යටතේ ලබා දිය යුතු ඉඩම්.**

| අනු අංකය | සම්පූර්ණ නම සහ ලිපිනය | වසම | කැබැලි අංකය | ප්‍රමාණය |
|---|---|---|---|---|
| 01 | කුලසිංහ ආරච්චිගේ සුජානි මධුෂංක මිය, ආරබොඩ ගෙදර, බූකැන්දයාය, කටුවන | ආරබොඩ | - | අක්. 02 |

**අ.ග.පි 152 වල්ගම්මුල්ල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි දීර්ඝකාලීන බදු ක්‍රමය යටතේ ලබා දිය යුතු ඉඩම්.**

| අනු අංකය | සම්පූර්ණ නම සහ ලිපිනය | වසම | කැබැලි අංකය | ප්‍රමාණය |
|---|---|---|---|---|
| 01 | මහදුරගේ හේමලතා මිය, තවාන, වල්ගම්මුල්ල, කිරම | වල්ගම්මුල්ල | කැ.අ. 1014 | අක්. 01 |

ගරු ප්‍රා.ස.ම.සිරිසේන හෙට්ටිගේ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු ප්‍රා.ස.ම.කේ.එච්. චන්ද්‍රසේන මැතිතුමා**

මෙම ඉඩම් පිළිබඳ සොයා බලන්න ඕන. අපිට ඉදිරියේදී අවශ්‍ය වන ඉඩම් මේ අතර තියෙන්න පුලුවන්. වාර්ෂිකව බදු දීම ගැටළුවක් නැහැ නමුත් දීර්ඝකාලීන බදු දීම ගැටළු සහගතයි. ඒ නිසා මේ පිළිබඳ සොයා බලන්න.

**ගරු ප්‍රා.ස.ම.යූ.ජී.ධර්මසිරි මැතිතුමා**

මේ ඉඩම් සඳහා අවසර ලබාදුන් විට නැවත ගන්න බැහැ. පසුකාලීනව ඔවුන්ටම මේවා අයිති වෙන අවස්ථා තියනවා.

**ගරු සභාපති අයි.ජී.මහින්ද මැතිතුමා**

මේ ඉඩම් අදාල කොට්ඨාශයේ මන්ත්‍රීවරු පිටපත් කර ගෙන ඉඩම් පිළිබඳ වාර්තාවක් ලබා දෙන්න. අප කාර්යාලයේ ආදායම් පරික්ෂකවරු මඟින් ද වාර්තාවක් ලබා ගෙන ලබන සභා වාරයට ඉදිරිපත් කරමු.

කටුවන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් දීර්ඝ කාලීන බදු ක්‍රමය යටතේ ලබා දීමට නියමිත ඉඩම් පිළිබඳ ලබන සභා වාරයට වාර්තාවක් ඉදිරිපත් කිරීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් ගරු ප්‍රා.ස.ම.සිරිසේන හෙට්ටිගේ මැතිතුමාගේ ස්ථිරත්වයෙන් සියලු මන්ත්‍රී වරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 10 – 2. පුරනැගුම ව්‍යාපෘතිය යටතේ කිරම බස් නැවතුම් පොළ ඉදිකිරීමේදී කපා දමා ඇති දැව සම්බන්ධව.

**( ගරු සභාපති අයි.ජී.මහින්ද මැතිතුමා )**

පුරනැගුම ව්‍යාපෘතිය යටතේ කිරම බස් නැවතුම් පොළ ඉදිකිරීමේදී කපා දමන ලද දැව තොගය මේ වන විට ව්‍යාපෘති භූමියට අවහිර වනසේ පවතින බවත්, එසේම එම දැව මේ වන විට විනාශ වෙමින් පවතින බවත් 2018.04.10 දින පැවති විගණන කළමනාකරණ කමිටු රැස්වීමේදී සාකච්ඡා කරන ලද බව පළාත් පාලන කොමසාරිස් 2018.04.11 දිනැති ලිපිය මඟින් පෙන්වා දී ඇත. ඒ අනුව මෙම දැව තොගය රාජ්‍ය දැව සංස්ථාව වෙත නොපමාව භාර දීමට කටයුතු කරන ලෙස තවදුරටත් දන්වා ඇත. එම දැව සම්බන්ධව පළාත් පාලන කොමසාරිස්ගේ නිර්දේශය ක්‍රියාත්මක කිරීම සුදුසු බව යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම.අයි.කේ. සුසන්ත මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී. ගස් පිටින්ම තියනවා. දැන් ටිකක් දිරලා ගිහින්.

**ගරු ප්‍රා.ස.ම.කේ.එච්. චන්ද්‍රසේන මැතිතුමා**

එම ගස් ටෙන්ඩර් කරලා ලැබෙන මුදල් සභා අරමුදලට බැර කරන්න.

**ගරු ප්‍රා.ස.ම.යූ.ජී.ධර්මසිරි මැතිතුමා**

සාධාරණ මුදලකට මේ දැව ටික වෙන්දේසි කරමු.

**ගරු සභාපති අයි.ජී.මහින්ද මැතිතුමා**

අපිට මේ තිබෙන දැව පිළිබඳ වාර්තාවක් තාක්ෂණික නිලධාරී හා ආදායම් පරීක්ෂකවරු හරහා නැවත ලබා ගන්න වෙනවා. ඉන් අනතුරුව දැව පිළිබඳ තක්සේරු කර වෙන්දේසි ලැබෙන මුදල් සභා අරමුදලට බැර කරමු.

කිරම බස්නැවතුම් පොළෙහි කපා දමා ඇති ගස් වෙන්දේසි කර ලැබෙන මුදල් සභා අරමුදලට බැර කිරීම සම්බන්ධ යෝජනාව ගරු ප්‍රා.ස.ම.යූ.ජී. ධර්මසිරි මැතිතුමා ස්ථිර කරන ලදි. එම යෝජනාව

සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 10 – 3 . හෙල්ලල කසල කළමනාකරණ ඉඩම සම්බන්ධව.

### ( ගරු සභාපති අයි.ජී.මහින්ද මැතිතුමා )

අප ආයතනය මගින් පවත්වාගෙන යන කසල කළමනාකරණ මධ්‍යස්ථානය මේ වන විට අක්‍රීය තත්ත්වයේ පවතී. එයට හේතු වී ඇත්තේ මේ වන විට ඒ සඳහා ක්‍රියාකාරී සේවකයින් හා යන්ත්‍ර සූත්‍ර නොමැති වීමයි. වර්තමානය වන විට දෛනිකව දිරන කසල කි.ග්‍රෑ. 1740 ක් පමණ හා නොදිරන කසල කි.ග්‍රෑම් 686 ක් පමණ එකතු වෙනවා. සේවකයින් තිදෙනෙකු යොදවා කසල වර්ගීකරණ කටයුතු කරන නමුත් ඔවුන් තිදෙනාට දිනක කසල වෙන් කර ගන්නත් දින කිහිපයක් ගත වෙනවා. සභාවේ සිටින කණිෂ්ඨ සේවකයින් බොහෝ දෙනෙක් ජල ව්‍යාපෘතිය සඳහා යොදවා ඇති බැවින් කසල ව්‍යාපෘතියේ වැඩ කටයුතු සඳහා යෙදවිය හැකි සේවකයින් නොමැත. එබැවින් කසල ව්‍යාපෘතිය අසාර්ථක වී තිබෙනවා. එය සාර්ථක කර ගැනීම සඳහා පහත සඳහන් කරුණු සපුරාගත යුතුවේ.

**01 - ස්ථානයේ වැඩ කටයුතු කිරීම සඳහා**

| | |
|---|---|
| මුර සේවයට | - 02 |
| ස්ථානභාර නිලධාරි | - 01 |
| සෞඛ්‍ය කම්කරු | - 06 |

**02. කසල බැහැර කිරීම සඳහා ඉඩම ප්‍රමාණවත් නොවීම.**

**03. සකස් කරන පොලිතින් අංගනය සඳහා ගේට්ටු හා දැල් ආවරණ නොමැති වීම.**

( ආරක්ෂිත වැටක් , ජලය ගබඩා කිරීමට ටැංකි , කොම්පෝස්ට් ගබඩා පහසුකම් සකස් කිරීම ,

අභ්‍යන්තර මාර්ග සකස් කිරීම අවශ්‍ය වේ )

**04. කොම්පෝස්ට් කුඩු කිරීමේ යන්ත්‍රයක්.**

ඉහත අංග සම්පූර්ණ කර ගත් විට කසළ ව්‍යාපෘතිය සාර්ථකව සිදුකර ගත හැක. ඒ සඳහා අවශ්‍ය සේවකයින් බඳවා ගැනීම, ආරක්ෂිත වැට සකස් කිරීම,කොම්පෝස්ට් ගබඩා පහසුකම් සකස් කිරීම, අභ්‍යන්තර මාර්ග පහසුකම් සපුරාලීම, ජලය ගබඩා කිරීම සඳහා ටැංකි ලබා ගැනීම හා කොම්පෝස්ට් කුඩු කිරීමේ යන්ත්‍රයක් ලබා ගැනීම සුදුසු බව යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රා.ස.ම.ඩබ්.එච්.ඒ. සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා ස්ථිර කරන ලදි. එම ප්‍රදේශය අවට්න්ම සේවකයින් බඳවා ගන්නවා නම් හොඳයි. නැත්නම් ඔවුන් වැඩට එන එකක් නැහැ.

<u>ගරු ප්‍රා.ස.ම.ගාමිණී ජයවික්‍රම මැතිතුමා</u>

කසල ඉඩම අවට ප්‍රදේශයේ ජනතාවට ලොකු ගැටළුවක්. මගේ ඉඩමට අල්ලපු ඉඩම. අපි ඉන්නේ ලොකු අපහසුතාවයකින්. මැස්සො, කුඹී පිරිලා. දරුවන්ට නිදහසේ කෑම කන්නවත් බැහැ. ගෙනත් දමන පොලිතින් අනිත් අයගේ ඉඩම් වලටත් යනවා. මගේ ඉඩමෙත් පොලිතින් පිරිලා. ඒවා හිටපු ලේකම් මහතා ඉවත් කරවා තිබුණා. මේ කසල ව්‍යාපෘතිය වෙන ස්ථානයකට ගෙන යන්න.

<u>ගරු ප්‍රා.ස.ම.යූ.ජී.ධර්මසිරි මැතිතුමා</u>

කසල ව්‍යාපෘතිය සාර්ථක කර ගන්න ක්‍රම වේදයක් හදා ගන්න. අපි කම්කරුවෝ සොයලා දෙන්නම්.

**ගරු ප්‍රා.ස.ම.කේ.එච්. චන්ද්‍රසේන මැතිතුමා**

කසල ව්‍යාපෘතිය සඳහා වෙනම සේවකයින් ගන්න පුළුවන්. සේවකයින් බඳවාගෙන කසල ව්‍යාපෘතිය සාර්ථක කර ගනිමු.

**ගරු ප්‍රා.ස.ම.ඩබ්.ඩී.එම්.ඩී. හරිස්චන්ද්‍ර මැතිතුමා**

අපි දිගින් දිගටම පෙර සභාවලත් මේ පිළිබඳ කතා කළා. මේ කුණු දාන්නේ නැහැ කිව්වා. විධිමත්ව කසල කළමනාකරණය කරනවා කිව්වා. නමුත් එහෙම වුනේ නැහැ. මේ වන විට ඒ කසල ගැටළුව මතුවෙලා තියෙනවා. ඒ කාලේ කසල ව්‍යාපෘතියට ලැබෙන කුණුත් මදි කිව්වා. එදා දවසේ අපට පෙන්වූ චිත්‍රය දැන් වෙන්නේ නැහැ. ඉඩමට වැට, ජලය, විදුලිය තියනවා. නමුත් කසල කළමනාකරණ මධ්‍යස්ථානයේ කළමනාකරණයේ ගැටළුවක් තියනවා. කුණු දානවා හැරෙන්න වෙන වැඩක් මෙම ස්ථානයේ වෙන්නේ නැහැ. මේ ඉඩමට කුණු දානවට පළමුව විරුද්ධ වුන කෙනා මම. මේ කසල කළමනාකරණ ව්‍යපෘතියේ සැලැස්ම ලබන සභා වාරයට ඉදිරිපත් කරන්න. සැලැස්මේ විදියට වැඩ කරන්නේ නැති නිසා ගැටළු ඇති වෙලා තියනවා.

**ගරු සභාපති අයි.ජී.මහින්ද මැතිතුමා**

කසල ව්‍යාපෘතියට අත්‍යාවශ්‍ය වන සේවකයින් 09 දෙනා දෛනික වැටුප් ලබා දීම සඳහා පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ඇතිව බඳවා ගැනීමට කටයුතු කරමු. එමෙන්ම ප්‍රතිපාදන ලබා ගෙන හෝ සභා අරමුදල් යොදවා හෝ කොම්පෝස්ට් කැබලිවලට කඩන මැෂින් එකක් ලබා ගමු. ඉන් අනතුරුව අනෙක් කටයුතු ප්‍රතිපාදන තිබෙන විදියට සම්පූර්ණ කරමු. අපි ඉන්න කාලේ මේ ඉඩම ගත්තා විතරයි. වැඩ පටන් ගත්තේ අපි නැති කාලයේ.

කසල ව්‍යාපෘතිය සඳහා සේවකයින් 06 දෙනෙකු බඳවා ගැනිම හා අදාළ යන්ත්‍ර ලබා ගැනීම මෙන්ම අනෙක් කටයුතු සම්පූර්ණ කිරීම සම්බන්ධ යෝජනාව ගරු ප්‍රා.ස.ම.ගාමිණී ජයවික්‍රම මැතිතුමා ස්ථිර කරන ලදී.

හෙල්ලල කසල කළමනාකරණ ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීම සඳහා සේවකයින් බඳවා ගැනීම හා අනෙක් අඩුපාඩු සකස් කර ගැනීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 10 – 4 . කටුවන පුවක්ගස්ආර ග්‍රාම නිලධාරි වසමේ පිහිටි සුසානභූමි ඉඩම සම්බන්ධව

**( ගරු සභාපති අයි.ජී.මහින්ද මැතිතුමා )**

කප්‍රාලේ/ඉ/මැනි/2017/40/ දරණ මැනුම් ඉල්ලීමට අනුව අ.ග.පි. 152 පුවක්ගස්ආර ග්‍රාම නිලධාරි වසමේ පිහිටි සුසානභූමි ඉඩමෙන් හෙක් 0.0506 ක ප්‍රමාණයක් දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පවරා දීම සඳහා මැනුම් කර අනු රේඛන සකස් කර ඇත. එම බිම් කැබැල්ල දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පවරා දීම සඳහා අපගේ එකඟතාවය ලබා දෙන ලෙස ප්‍රාදේශීය ලේකම් ඉල්ලා සිටිනවා. එම ඉල්ලන ලද ප්‍රමාණය අදාළ ආයතනයට පවරා දීමට පළාත් පාලන සහකාර කොමසාරිස් මඟින් විෂයභාර අමාත්‍යවරයාට දන්වා යවා අනුමැතිය ලබා ගනීමට කටයුතු කරමු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම.එම්.පී.සී. කැලුම් තුෂාර ගරුසිංහ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී. එම ඉඩම සුසාන භූමියකට වඩා රාජ්‍ය ආයතනයකට ලබා දෙනවා නම් වටිනවා.

**ගරු ප්‍රා.ස.ම.කේ.එච්. චන්ද්‍රසේන මැතිතුමා**

සුසානභූමිය හා භූමදාන ආඥා පනත වෙනස් කරන්න අපට තියා කාටවත් බැහැ. එය සුද්දගේ කාලේ හදපු එකක්. ඒක තවම සිංහලයට පරිවර්තනය වෙලත් නැහැ. පුවක්ගස්ආර ග්‍රා.නි.ව සුසානභූමි ඉඩම් 02 ක් තියනවා. මෙම සුසාන භූමි ඉඩම් වෙනත් කටයුතු සඳහා නිදහස් කරන්න බැහැ. ඒ වෙනුවට විකල්පය ඉඩමක් දෙන්න ඕන.

ගරු ප්‍රා.ස.ම.ජේ.චන්ද්‍රලතා මැතිතුමිය

සුසාන භූමි ඉඩම් වල ගොඩනැගිලි හදන්න පුළුවන්ද? ගම්මැද තිබෙන ඇතැම් සුසාන භූමි ඉඩම්වල එවැනි ඉදි කිරීම් කර තිබෙනවා. එලෙස ඉදි කිරීම් කරන්න පුළුවන්ද?

ගරු ප්‍රා.ස.ම.කේ.එච්. චන්ද්‍රසේන මැතිතුමා

සුසාන භූමි ඉඩම් කිසිදු කාර්යකට යොදා ගත නොහැකි බව දක්වා තිබෙනවා. නමුත් මේ ස්ථානවල ප්‍රජා ශාලා, පෙර පාසල් සකස් කර තිබෙනවා. ඒවා ඔක්කොම ආදාල ප්‍රදේශයේ ජනතාවට භාවිතා කරන්න අවශ්‍ය නිසා හදලා තියනවා.

ගරු සභාපති අයි.ජී.මහින්ද මැතිතුමා

නීතිමය අණ පනත් අනුව සුසානභූමි ඉඩම් වෙනත් කාර්යකට යොදවන්න බැහැ. ඒ නිසා මෙම ඉඩම් කොටස විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන ඒ අනුව කටයුතු කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම.යූ.ජී.ධර්මසිරි මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

පුවක්ගස්ආර සුසානභූමියෙන් හෙක් 0.0506 ඉඩම් කොටසක් විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව අදාළ ආයතනයට පවරා දීම සඳහා එකඟතාවය ලබා දීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රී වරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 10 – 5 . ආයතනික හැඳුනුම්පත් සකස් කිරීම හා නාම පුවරු සකස් කිරීම

**( ගරු සභාපති අයි.ජී.මහින්ද මැතිතුමා )**

කටුවන ප්‍රාදේශිය සභාවට තේරී පත් වූ ගරු සභාපතිතුමා ඇතුළු සියළුම මන්ත්‍රීවරුන්ට හා ආයතනයේ දැනට සේවය කරන සේවක හැඳුනුම්පත් නොමැති සියළු දෙනාට සේවක හැඳුනුම්පත් ලබා දීමට හා ගරු සභාපතිතුමා ඇතුළු සියළුම මන්ත්‍රීවරුන්ට මෙන්ම ආයතනයේ සේවය කරන නිලධාරීන්ට නාම පුවරු සකස් කළ යුතු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. සිරිසේන හෙට්ටිගේ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

එම යෝජනාව පිළිබඳ විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 10 – 6 . මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම.

**( ගරු ප්‍රා.ස.ම.ඩබ්.එච්.ඒ. සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා )**

කුඩගොඩ, දඹේතලාව, මුරුංගස්යාය යන කොට්ඨාසවල ප්‍රතිසංස්කරණය කිරීමට මාර්ග බොහෝ ප්‍රමාණයක් තියනවා. එම මාර්ග මෝටර් ග්‍රේඩර් කරන ලෙස යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම.කේ. සුනිල් ශාන්ත කුමාර මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

ගරු සභාපති අයි.ජී.මහින්ද මැතිතුමා

අපි අත්‍යාවශ්‍යම මාර්ග ප්‍රථමයෙන් ප්‍රතිසංස්කරණය කරමු. ප්‍රතිසංස්කරණය කළ යුතු මාර්ග ලේඛනය ලබා දුන් පසු ඇස්තමේන්තු සකස් කර මෝටර් ග්‍රේඩර් කර දෙන්නම්.

කුඩගොඩ, දඹේතලාව, මුරුංගස්යාය යන කොට්ඨාසවල මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 10 – 7. දසමස් වැටුප් අත්තිකාරම් මුදල් ලබා ගැනීම

**( ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා )**

සභාවේ සේවය කරන පහත නම් සඳහන් නිලධාරීන්ට හා සේවකයින්ට ආයනතය මඟින් ලබා දෙන දසමස් වැටුප් අත්තිකාරම් මුදල් පොරොත්තු ලේඛනය අනුව ලබා දීම සුදුසු යැයි යෝජනා කරමි.

01. සංවර්ධන නිලධාරී - චමින්ද ගමගේ මයා
02. වැඩ ක්ෂේත්‍ර කම්කරු - ජේ. චරිතා කුමාරි මිය

ගරු ප්‍රා.ස.ම. සිරිසේන හෙට්ටිගේ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඉහත නම් සඳහන් නිලධාරීන්ට පොරොත්තු ලේඛනය අනුව දසමස් වැටුප් අත්තිකාරම් මුදල් ලබා දීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 10 – 8 . සභාව සතු වාහන රක්ෂණය කිරීම

**( ගරු සභාපති අයි.ජී.මහින්ද මැතිතුමා )**

කටුවන ප්‍රාදේශීය සභාව සතු පහත සඳහන් වාහනවල රක්ෂණ කාලසීමාව අවසන් වී ඇති බැවින් එම වාහන සඳහා රක්ෂනාවරණ ලබා ගැනීමට අනුමැතිය ඉල්ලා ඇත. එහිදී 2017.10.024 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ 03/03/සභා/පොදු/2017 අංක දරණ ලිපිය මඟින් අමාත්‍යවරුන්ගේ වාහන, නිල වාහන, කුලී සින්නක්කර ක්‍රමයට අත්කර ගෙන ඇති වාහන හැර අනෙකුත් දකුණු පළාත් සභාව තුළ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් පාලන ආයතන හා අධිකාරී යන ආයතනවල ධාවනයට යොදා ගන්නා සංචිත වාහන සඳහා තුන්වන පාර්ශවයේ රක්ෂණයක් පමණක් ලබා ගන්නා ලෙස දන්වා ඇත. මෙම ලිපිය අනුව අපගේ වාහන සඳහා රක්ෂණාවරණ ලබා ගැනීම සුදුසු යැයි යෝජනා කරමි.

01 . MA - 330 මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය

02 . SPZA – 2975 බැකෝ යන්ත්‍රය

03 . SNH - රෝඩ් රෝල

04 . 270-0429 ට්‍රැක්ටරය

ගරු ප්‍රා.ස.ම.එච්.ජී. ගාමිණී සංජීව මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු ප්‍රා.ස.ම.අයි.කේ. සුසන්ත මැතිතුමා**

තුන්වන පාර්ශවයේ රක්ෂණාවරණයක් දැමූ විට අනතුරක් වුණත් අපි හදන්න ඕන.

**ගරු ප්‍රා.ස.ම. ඊ.බී. ඉන්දික මැතිතුමා**

තුන්වන පාර්ශවයේ රක්ෂණාවරණයක් දාන එක හොඳයි. එවිට අනතුරක් වූ විට රියදුරන් අතින් හදන්න වෙයි කියා වාහනය ආරක්ෂා කර ගන්නවා.

**ගරු ප්‍රා.ස.ම.එච්.ජී. ගාමිණී සංජීව මැතිතුමා**

තෝරා ගත් වාහන සඳහා පූර්ණ රක්ෂණාවරණයක් ලබා දී අනෙක් වාහන සඳහා තෙවන පාර්ශවයේ රක්ෂණාවරණයක් ලබා ගමු. නිතරම ධාවනය වන කැබ් රථ, වෑන් රථ, බැකෝ යන්ත්‍රය, බවුසර් සඳහා පූර්ණ රක්ෂණාවරණයක් ලබා ගන්න.

**ගරු ප්‍රා.ස.ම.කේ.එච්. චන්ද්‍රසේන මැතිතුමා**

අපි වාහනවලට පූර්ණ රක්ෂණාවරණයක් ලබා දීම සඳහා ලක්ෂ 10 ට වඩා වැය කරනවා. නමුත් ලක්ෂ 02 ට වඩා ක්ලේම් අරගෙන නැහැ. මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය, බැකෝ යන්ත්‍රය , රෝඩ් රෝල, ට්‍රැක්ටර් සඳහා තුන්වන පාර්ශවයේ රක්ෂණාවරණයක් ලබා ගමු. අනෙක් වාහන සඳහා පූර්ණ රක්ෂණාවරණයක් ලබා ගමු.

**ගරු සභාපති අයි.ජී.මහින්ද මැතිතුමා**

ආයතනය තුළ නිතරතුරුවම ධාවනය වන කැබ් රථ දෙක, වෑන් රථය හා බවුසර් සඳහා පූර්ණ රක්ෂණාවරණයක් ලබා ගමු. සභාව සතු අනෙක් සියළු වාහන සඳහා තෙවන පර්ශවයේ රක්ෂණාවරණයත් ලබා ගමු. එමෙන්ම 53 – 1634 කැබ් රථය භාවිතා කළ නොහැකි නිසා මේ වන විට ධාවනයෙන් ඉවත් කර තිබෙනවා. එම කැබ් රථයත් අළුත්වැඩියා කළ යුතුයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම.එච්.ජී. ගාමිණී සංජීව මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

ආයතනය සතු නිතර ධාවනය වන කැබ් රථ දෙක, වෑන් රථය හා බවුසර් සඳහා පූර්ණ රක්ෂණාවරණයක් ලබා ගැනීමට හා අනෙක් සියළු වාහන සඳහා තෙවන පර්ශවයේ රක්ෂණාවරණයක් ලබා ගැනීම මෙන්ම 53 – 1634 කැබ් රථය අළුත්වැඩියා කිරීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 10 – 9 . ස්ථාවර තැන්පත්වල මුදල් ආයෝජනය කිරීම.

**( ගරු සභාපති අයි.ජී.මහින්ද මැතිතුමා )**

2017.09.29 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුවේදී සාමාන්‍ය වියදම ඉක්මවා සභාව සතු ගිණුම්වල ඇති මුදල්වලින් රු. 7500000 ක මුදලක් ස්ථාවර තැන්පතුවක ආයෝජනය කිරීම සඳහා තිරණය කර ඇත. එහිදී රජයේ බැංකු මඟින් ස්ථාවර තැන්පත් පොළී අනුපාතයන් පිළිබඳ විමසීමක් කර ඒ වන විට ඉහළම පොළී අනුපාතය ( 11 % ) දෙන බවට සඳහන්ව තිබූ ලංකා බැංකුවෙහි මාස තුනකින් කල් පිරුණු පසු පොලිය සමඟ ස්ථාවර තැන්පතුව නැවත අළුත්වන ආකාරයට රු. 5000000.00 ක් හා රු. 2500000 .00 බැගින් වූ ස්ථාවර තැන්පත් 02 ක් 2017.11 . 02 දින ආරම්භ කර ඇත.

එම ස්ථාවර තුන්පතුව කල් පිරීමෙන් පසු නැවත අලුත් වීමේදී ගෙවනු ලබන පොළී අනුපාතය 10.25% ක් බව ලංකා බැංකුව මඟින් දන්වා ඇත. ඒ අනුව 2018.04.18 දින රජයේ අනෙකුත් බැංකු මඟින් නැවත පොළී අනුපාතයන් පිළිබඳ විමසීමක් කරන ලදි. එහිදී වැඩිම පොළී අනුපාතය ඉදිරිපත් කර ඇත්තේ ( 11% ) ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසිනි.එම බැංකුව විසින් විශේෂ පොළී අනුපාතයක් 2018.04.01 වන දින සිට 2018.04.20 වන දින දක්වා තැන්පත් කරන ආයෝජන සඳහා ලබා දෙන බව දන්වා ඇත. ඒ අනුව ලංකා බැංකුවෙහි ආයෝජනය කර තිබූ රු. 7500000 ක මුදල ඉන් ඉවත් කර මාස 03 ක් සඳහා 11% පොළී අනුපාතයක් ලබා දෙන ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ 2018.04.20 දින සිට ආයෝජනය කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම.එච්.ජී. ගාමිණී සංජීව මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි. වැඩි පොළියක් දෙන නිසා මාස 03 ට එම බැංකුවේ තැන්පත් කරමු.

ලංකා බැංකුවේ ආයෝජනය කර ඇති රු. 7500000 ක මුදල එම බැංකුවෙන් ඉවත් කර වැඩි පොළියක් ( 11% ) ලබා දෙන ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ මාස තුනක කාල සීමාවක් සඳහා ආයෝජනය කිරීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 10 – 10 . මහජන සම්බන්ධීකරණ නිලධාරී පත් කිරීම.

**( ගරු සභාපති අයි.ජී.මහින්ද මැතිතුමා )**

ප්‍රාදේශීය සභාවේ සභාපති ලෙස පත් වූ මා හට වැඩ කටයුතු කර ගෙන යාම සඳහා මහජන සම්බන්ධීකරණ නිලධාරී කෙනෙකු පත් කර ගැනීමට අවශ්‍ය වේ. ඒ සඳහා සරත්චන්ද්‍ර අබේසිංහ මහතා සුදුසු බවත්, ඔහුට ලැබිය යුතු දීමනා ලබා දීම සුදුසු බවත් යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. සිරිසේන හෙට්ටිගේ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

ගරු සභාපතිතුමාගේ මහජන සම්බන්ධීකරණ නිලධාරී ලෙස සරත්චන්ද්‍ර අබේසිංහ මැතිතුමා පත් කිරීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 10 – 11 . කටුවන පොළෙහි මාළු වළ හා මහජන වැසිකිළිය සම්බන්ධව.

**( ගරු ප්‍රා.ස.ම.යූ.ජී.ධර්මසිරි මැතිතුමා )**

කටුවන වෙළඳ පොළ දැන් තිබෙන ස්ථානය දැඩි ලෙස අපවිත්‍ර වී තිබෙනවා. වැසිකිළිය භාවිතා කරන්නවත් බැහැ. ඉතා විශාල දුර්ගන්ධයක් මතු වෙනවා. මෙම ස්ථානයෙන් වැසිකිළිය ඉවත් කරමු. එමෙන්ම එහි වතුර අපතේ යාමක් සිදු වෙනවා. කටුවන අළුත් පොළක් සකස් කරපු නිසා මෙම වැසිකිළිය ඉවත් කිරීම මඟින් ගැටළුවක් ඇති වෙන්නෙ නැහැ. ඒ වාගේම මාළු වළ පිරිලා . ඒවායේ එළවළු දාලා. මේවා එකට එකතු වෙලා අවට ජනතාවට ඉන්න බැරි විදියට දුගඳ හමනවා. ඒ නිසා මෙම වැසිකිළිය හා මාළු වළ ගලියක් යොදා ඉවත් කරන ලෙස යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම.කේ. ඒ. ප්‍රේමතිලක මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**<u>ගරු ප්‍රා.ස.ම.කේ.එච්. චන්ද්‍රසේන මැතිතුමා</u>**

කටුවන නගරයට පොදු වැසිකිළියක් නැහැ. ඒ නිසා පොලේ වැසිකිළිය තියෙන්න ඕන. පාවිච්චි කරන්න පුළුවන් විදියට වැසිකිළිය හදමු.

**<u>ගරු සභාපති අයි.ජී.මහින්ද මැතිතුමා</u>**

කටුවන පොළෙහි වැසිකිළිය හා මාළු වළ ගලියක් යොදා පිරිසිදු කර දෙන්නම්. ඒ වාගේම මිද්දෙනිය පොලේ වැසිකිළියත් පිරිසිදු කරන්න ඕන. ඒ නිසා කටුවන හා මිද්දෙනිය පොළ වැසිකිළි දෙක හා කටුවන පොළ මාළු වළ ගලි බවුසරයක් යොදා පිරිසිදු කරමු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම.එච්.ඒ. ගාමිණී සංජීව මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි

කටුවන පොළ හා මිද්දෙනිය පොළ වැසිකිළි දෙක මෙන්ම කටුවන පොළ මාළු වළ ගලි බවුසරයක් යොදා පිරිසිදු කිරීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 10 – 12 . ජල අංශයේ නඩත්තු කටයුතු සඳහා සේවකයින් බඳවා ගැනීම හා ස්කැවේටර් යන්ත්‍රයක් ලබා ගැනීම.

**( ගරු සභාපති අයි.ජී.මහින්ද මැතිතුමා )**

දැනට ආයතනය පවත්වා ගෙන යන ජල ව්‍යාපෘතිය මඟින් 3500ට අධික පාරිභෝගික සංඛ්‍යාවක් ජලය පරිහරණය කරයි. මෙම ජල ව්‍යාපෘතිය පුළුල් ප්‍රදේශයක පවතින අතර, ජල ව්‍යාපෘතියේ නඩත්තු කටයුතු, නව ජල සම්බන්ධතා ලබා දීම් දෛනිකව සිදු කිරීමට වේ. මෙහිදී දිනකට ජල පැමිණිලි 10 ට වැඩි ප්‍රමාණයක් හා නව ජල සම්බන්ධතා සතියකට 06ක් හෝ 08 ක් පමණ ලැබේ.

මෙම සියළුම කාර්යයන් සඳහා යොමු කළ යුතු ජල පයිප්ප වැද්දුම්කරුවන් සිටිනුයේ එක් අයෙකු පමණි. නමුත් මෙම කාර්යන් එක් අයෙකු යොදවා කළ නොහැකි බැවින් වැඩ ක්ෂේත්‍ර කම්කරුවන්ද මෙම ජල ව්‍යාපෘතියේ කාර්යයන් සඳහා යොදවා ඇත. ඔවුන් ජල ව්‍යාපෘතියේ කාර්යයන් සඳහා යොදවා ඇති බැවින් මාර්ග අංශයේ නඩත්තු කටයුතු අතපසුවී තිබේ. එම නිසා මේ කාර්යයන් කාර්යක්ෂම කර ගැනීම සඳහා ජල පයිප්ප වැද්දුම්කරුවන් දෙදෙනෙකුවත් අවශ්‍යවේ.

ජල ව්‍යාපෘතියේ මෙම කාර්යයන් සිදු කිරීමේදී භූගත කැණීම් සිදු කරනුයේ සභාවේ සේවකයින්ගේ ශ්‍රමය යොදවා වන අතර, එම නිසා මෙම කටයුතු සඳහා බොහෝ කාලයක් වැය වේ. එහිදී දිනකට නඩත්තු හෝ නව ජල සම්බන්ධතා දෙකකට වඩා ලබා දිය නොහැක. එබැවින් මෙම ජල ව්‍යාපෘතිය මඟින් ජනතාවට වඩාත් කාර්යක්ෂමව හා ඵලදායීව සේවයක් ලබා දීම සඳහා කැණීම් කටයුතු සඳහා ස්කැවේටර් යන්ත්‍රයක්ද ලබා ගත යුතුවේ. ජල අංශයේ සේවය කරන අපගේ කාර්ය මණ්ඩලයද සේවකයින් හා යන්ත්‍ර නොමැතිව සිදු කිරීම මඟින් පාරිභෝගික ජනතාව අපහසුතාවයට පත් වන බව දිගින් දිගටම දන්වා ඇත. එම නිසා මෙම ජල ව්‍යාපෘතියේ නඩත්තු කටයුතු හා නව ජල සම්බන්ධතා මෙන්ම ජල ව්‍යාපෘතියේ අනෙකුත් කටයුතු වෙනුවෙන් ජල පයිප්ප වැද්දුම්කරුවන් දෙදෙනෙකු පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ඇතිව බඳවා ගැනීමට හා ස්කැවේටර් යන්ත්‍රයක් මිළදී ගැනීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම.ගාමිණී ජයවික්‍රම මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි. සේවකයින් හා යන්ත්‍ර ලබා ගන්න එක ගොඩක් හොඳයි. නැතිනම් ජල ව්‍යාපෘතියේ නඩත්තු කටයුතු නිසි පරිදි කරන්න අමාරුයි. ඇතැම් අවස්ථාවල සේවකයින් නොමැති නිසා බටලයින් කැඩුණු විට දවස් ගණන් වතුර අපතේ යනවා.

ජල ව්‍යාපෘතියේ නඩත්තු කටයුතු හා නව ජල සම්බන්ධතා මෙන්ම ජල ව්‍යාපෘතියේ අනෙකුත් කටයුතු වෙනුවෙන් ජල පයිප්ප වැද්දුම්කරුවන් දෙදෙනෙකු පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ඇතිව බඳවා ගැනීමට හා ස්කැවේටර් යන්ත්‍රයක් මිළදී ගැනීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 10 – 13 . සභා බල ප්‍රදේශයේ කොට්ඨාස 17 තුළ සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කිරීම.

**( ගරු සභාපති අයි.ජී.මහින්ද මැතිතුමා )**

සභා බල ප්‍රදේශයට අයත් කොට්ඨාස 17 ට අදාළව මන්ත්‍රීවරු විසින් ලබා දී ඇති පහත සඳහන් මාර්ග ඇස්තමේන්තු සකස් කර සභා අරමුදල් යොදවා ප්‍රතිසංස්කරණය කිරීමටත්, අනෙක් කර්මාන්ත පළාත් පාලන කොමසාරිස් වෙත යොමු කර අනුමැතිය ලබා ගෙන සිදු කළ යුතු බව යෝජනා කරමි.

**ව්‍යාපෘතියේ නම**

01 . කෙසෙල්වත්තේ සිට පොල්අත්තේගොඩ දක්වා මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම.

02 . අඹගස්මුල්ල පන්සල ළඟ සිට ඉදිරියට ඇති මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම.

03 . හෙල්ලල ග්‍රා.නි.ව. බුලුගහගොඩ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම.

04 . ලබුහේන්ගොඩ පාසල අසලින් රිකිල්ලපාන වැව සමඟ අඹගස්ආර පාරට වැටෙන මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම.

05 . පැලවත්තයාය ඉත්තකුරුගොඩ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම.

06 . හොරවින්න තල්ගස්රුප්ප මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම.

07.මිද්දෙනිය නැගෙනහිර සමූහ ගොවිපලේ පළමු හරස් මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම. ( පෙර පාසල අසලට වැටෙන මාර්ගය )

08.වැලිපිටිය ආදළුගොඩ මාර්ගයේ සිට මාරගස්වත්ත මාර්ගයේ තේනගම ගෙදර මාර්ගය

ප්‍රතිසංස්කරණය කිරීම.

09 . පිස්සුගොඩැල්ල මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම.

10 . ගොමඩිය පොළ ප්‍රතිසංස්කරණය කිරීම.

11 . කටුවන ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල සකස් කිරීම.

12 . වල්ගම්මුල්ල අකුරුස්ස වත්ත ඉදිරිපිට වික්‍රමසූරිය මාවත ප්‍රතිසංස්කරණය කිරීම.

13 . පොතුවිල බමහේන මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම.

ගරු ප්‍රා.ස.ම.යූ.ජී.ධර්මසිරි මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි. බල ප්‍රදේශයේ කොට්ඨාස තුළ එවැනි සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කරන එක ගොඩක් හොඳයි. එහිදී අත්‍යාවශ්‍යම මාර්ග ප්‍රථමයෙන් ප්‍රතිසංස්කරණය කරමු.

කොට්ඨාස 17 තුළ මාර්ග සහා අරමුදල් හා යන්ත්‍ර සූත්‍ර යොදවා ප්‍රතිසංස්කරණය කිරීමටත්, අනෙකුත් කර්මාන්ත ප්‍රතිපාදන වෙන් කරවා ගෙන පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගෙන සිදු කිරීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සහා සම්මත විය.

## 10 – 14 . හැඩිවත්ත ආදාහනාගාරයේ ඇති අඩු පාඩු සම්බන්ධව

**( ගරු සභාපති අයි.ජී.මහින්ද මැතිතුමා )**

2014 වර්ෂයේ සංවර්ධන වැඩසටහන යටතේ පළාත් නැගුම සංවර්ධන යෝජනා අනුව අප අයතනයට ආදාහනාගාරය ලැබී ඇත. එහි වැඩ අවසන් කර වසරකට අධික කාලයක් ගෙවී ගියත් තවම විවෘත කිරීමට නොහැකි වී ඇත. එයට හේතු වී ඇත්තේ පහත සඳහන් අඩුපාඩු සම්පූර්ණ කර ගත නොහැකි වූ නිසාවෙනි. එම නිසා එම අඩු පාඩු සකස් කර ගත් පසු අපිට ආදාහනාගාරයේ වැඩ ආරම්භ කරන්න පුළුවන්.

01. ආදාහක ක්‍රියාකරු - 01 සහායක - 01

02. මුරකරුවන් -

රාත්‍රී කාලයට - 02

දහවල් කාලයට - 01

03. උද්‍යාන අලංකරණ කටයුතු සිදු කිරීම ( වැට සකස් කිරීම හා අලංකරණය )

ඒ අනුව ආදාහනාගාරයේ වැඩ ආරම්භ කිරීම සඳහා අවශ්‍ය වන ඉහත සඳහන් සේවකයින් 05 දෙනා පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ඇතිව බඳවා ගැනීමට හා අලංකරණ කටයුතු සිදු කිරීම මෙන්ම එම ඉඩම පවරා දෙන ලෙස කටුවන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ඉල්ලීම් කළ යුතු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම.කේ. ඒ. ප්‍රේමතිලක මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි. හැඩිවත්ත ආදාහනාගර ඉඩමත් පවරා ගන්න ඕන. ආදාහනාගාරයේ වැඩ ආරම්භ කරන්න මේ බඳවා ගැනීම් ඉක්මනින් සිදු කරන්න.

<u>ගරු සභාපති අයි.ජී.මහින්ද මැතිතුමා</u>

අපි හැඩිවත්ත සුසාන භූමි ඉඩම සභාවට පවරා දෙන්න කියා කටුවන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ඉල්ලීම් කරමු. ආදාහනාගාරයට අදාළ තනතුරු සඳහා පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ඇතිව බඳවා ගැනීම් කරමු.

ආදාහනාගාරය ක්‍රියාත්මක කිරීමට අදාළ තනතුරු පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ඇතිව ලබා ගැනීමට හා අලංකරණ කටයුතු සිදු කිරීම මෙන්ම හැකිවත්ත පොදු සුසානභූමි ඉඩම සභාවට පවරා දෙන ලෙස කටුවන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ඉල්ලීම් කිරීම් සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 10 – 15 . සභා බල ප්‍රදේශයේ කොට්ඨාස 17 තුළ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම.

**( ගරු සභාපති අයි.ජී.මහින්ද මැතිතුමා )**

සභා බල ප්‍රදේශය තුළ මෙතෙක් මන්ත්‍රීවරුන් විසින් ප්‍රතිසංස්කරණය කිරීමට ඉදිරිපත් නොකරන ලද මාර්ග බොහෝ ප්‍රමාණයක් තියනවා. එම මාර්ග අපි සකස් කළ යුතුයි. එසේ මාර්ග සකස් කිරීමේදී ඇතැම් ස්ථානවලට බෝක්කු යෙදීමට සිදු වෙනවා. එහිදී යෙදීමට අවශ්‍ය වන සිලින්ඩර් අපිට මිලදී ගන්න ඕන. ඒ අනුව එක් කොට්ඨාසයකින් 5km වන පරිදි කොට්ඨාස 17 හිම මාර්ග ප්‍රතිසංස්කරණය කළ යුතු අතර, එම මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේදී යෙදීමට සිදුවන බෝක්කු සඳහා සිලින්ඩර් මිලදී ගැනීම ද සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම.ශාන්ත ජයලත් මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි. ඇතැම් ගම්වල කිසිවකුගේ අවධානය යොමු නොවූ මාර්ග තියනවා. ඒ නිසා මෙලෙස එක් කොට්ඨාසයකින් 5km වන ලෙස මාර්ග ප්‍රතිසංස්කරණ කිරීම ගොඩක් වටිනවා.

සභා බල ප්‍රදේශයේ කොට්ඨාස 17 තුළ එක් කොට්ඨාසයකින් 5km ආවරණය වන පරිදි මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම හා එම මාර්ගවලට යෙදීමට අවශ්‍ය බෝක්කු සඳහා සිලින්ඩර් මිළදී ගැනීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 11 - ප්‍රගතිය සාකච්ඡා කිරීම.

**ගරු ප්‍රා.ස.ම.යූ.ජී.ධර්මසිරි මැතිතුමා.**

ගරු සභාපතිතුමා, ගරු උප සභාපතිතුමා, ගරු මන්ත්‍රීවරු සියළු දෙනාගෙන් අවසරයි. කොට්ඨාස 17 ට තේරී පත් වූ මන්ත්‍රීවරු 17 දෙනෙක් ඉන්නවා. මේ 17 දෙනා කොට්ඨාස 17 සංවර්ධනය සඳහා කටයුතු කළ යුතුයි. එම 17 දෙනාට අමතරව විපක්ෂයේ මන්ත්‍රීවරුත් සිටිනවා. අපි සියළු දෙනාම කොට්ඨාස වෙනුවෙන් කතා කළ යුතුයි. සභාවේ කටයුතු ගැටළුවක් නැතිව පවත්වා ගෙන යමු.

තම කොට්ඨාසවලට අදාළව මාර්ග, වීථි ලාම්පු, පෙර පාසල්, ප්‍රජා ශාලා හා පුස්තකාල අංශ කෙරෙහි අවධානය යොමු කර ඒවා දියුණු කරන්න කටයුතු කරමු. කටුවන නගරයේ අනෙක් ස්ථානවලට වඩා මාර්ග ගැටළු තියනවා. කටුවන කොට්ඨාසයේ ඇතැම් ස්ථානවල තවම අඩි පාරවල් තියනවා. මේවා ප්‍රතිසංස්කරණය කළ යුතුයි. හඳුගල, වරාපිටිය ආදී ගම්මානවල සංවර්ධනය කිරීම පිළිබඳ අපි සතුටු වෙනවා. චන්ද්‍රසේන මන්ත්‍රීතුමාට මධ්‍යම ආණ්ඩුවෙන් ලොකු මුදලක් ගෙන්වා ගන්න පුළුවන්. එලෙස ප්‍රතිපාදන ලබා ගන්න හැකියාවක් ලැබෙන්න කියා ඉල්ලා සිටිනවා.

අද මෙලෙස සභාව ගැටළුවක් නැතිව පවත්වා ගෙන යන්න ලැබීම ගැන සතුටු වෙනවා. අනෙක් ස්ථානවල මේ වාගේ ප්‍රථමයෙන් ආරම්භ කළ සභාවල ගැටළු තිබෙනවා. නමුත් අපි එහෙම නැහැ. නයකත්වයට ගරු කරනවා. අර්බුද ඇති කර ගන්නෙ නැහැ. ප්‍රශ්න නැතිව පහසුවෙන් පවත්වා ගෙන ගිය ලංකාවෙ එකම සභාව කටුවන සභාව. මාධ්‍යවේදීන් මේ පිළිබඳව වාර්තා කළ යුතුයි. මේ සභාවේ හැම පක්ෂයක්ම වාගේ වරින් වර බලයට පත් වී තිබෙනවා. ඔවුන් සමඟ අපි සහයෝගයෙන් වැඩ කළා. සංවර්ධන යෝජනාවලට, අය - වැයට අපි විරුද්ධ වුනේ නැහැ.

ඉදිරියේදි අය වැය සකස් කිරීමේදී සභාපතිතුමා තනියම අය වැය සකස් කරන්න එපා. සියළුම මන්ත්‍රීවරු සහභාගි කරවා ගන්න. සභාවක් ලෙස සියළුම කටයුතු සඳහා වියදම් දරන්නෙ අමාරුවෙන්. මන්ත්‍රීතුමන්ලා ලොකු දේවල් ඉල්ලන්න එපා. ප්‍රතිපාදන ලබා ගන්න විවිධ ආයතන, මැති ඇමතිවරු සිටිනවා. ඔවුන්ගෙන් සහයෝගය ලබා ගන්න.

අපේ සියළුම සභිකවරුන්ට ප්‍රාදේශීය සභා පනත ගෙන්වා දෙන්න. ඒ වාගේම ඒ පිළිබඳ පුහුණු කඩිනමින් ලබා දෙන්න කියා ඉල්ලා සිටිනවා. කටුවන සභාව වාසනාවන්ත සභාවක් ලෙස පවත්වා ගෙන යාමට හැකියාව ලැබේවා කියා ප්‍රාර්ථනා කරනවා.

**<u>ගරු සභාපති අයි.ජී.මහින්ද මැතිතුමා</u>**

හිටපු සභාපතිතුමා දීර්ඝ පැහැදිලි කිරීමක් කළා. අපි ප්‍රාදේශීය සභා පනත ගෙන්වා ගන්න අවශ්‍ය කටයුතු කර තියනවා. ඉදිරියේදී සියළුම මන්ත්‍රීවරුන්ට ප්‍රාදේශීය සභා පනත පිළිබඳ පුහුණු ලබා දෙනවා.

**<u>ගරු ප්‍රා.ස.ම.ගාමිණී ජයවික්‍රම මැතිතුමා.</u>**

මිද්දෙනිය පොළ දැන් අරාජික වෙලා. වහලේ වැහි පීළි කැඩිලා. මාළු මාකට් එකත් ගන්න දෙයක් නැහැ. පොළ ඉවර වුණාම මාළු ලැලිවල ගඳ එනවා. ඒ වාගේම වාහන නවත්වන්නෙ පාර දෙපැත්තෙ. වෙන වාහනයකට යන්න බැහැ. ඒ වාගේම තොග පොළ පහළ තියන නිසා දැන් වෙළඳුන් එනවා අඩුයි. තොග පොළට පළතුරු එන්නෙම නැති තරම්. ඒ නිසා මේ ගැටළු සඳහා විසඳුමක් ගන්න ඕන. ඊට පෙර අපේ සියළුම මන්ත්‍රීවරු ගොස් පොළ පරික්ෂා කර බලන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු ප්‍රා.ස.ම.අයි.කේ. සුසන්ත මැතිතුමා .</u>**

හැම පොළකම මාළු කපලා අපද්‍රව්‍ය බෝක්කු ළඟ, කිරම ධම්මානන්ද විද්‍යාලය ළඟ දාලා යනවා. ඒ වාගේම කිරම උප කාර්යාලය ළඟ හා කිරම බස්ටැන්ඩ් එක ළඟත් දාලා යනවා. අපි මේ පිළිබඳ මාළු පොලේ වෙළඳුන් දැනුවත් කරන්න ඕන. මාළු අපද්‍රව්‍ය දාන්න යකඩ බැරල් භාගයක්වත් තියලා ඒකට දාන්න කියමු. එදාම ඒ අපද්‍රව්‍ය අරගෙන එන්න ඕන. නැත්නම් පොළ අවට ජනතාවට ඉන්න බැරි වෙයි.

**<u>ගරු ප්‍රා.ස.ම.ඩබ්.එච්.ඒ. සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා.</u>**

මිද්දෙනිය පොළට එන්න තිබෙන ගොඩක් එළවලු පළතුරු මුල් ඇඩියාවල පොළට යනවා. ඒ නිසා අපි තොග පොළ වෙනස් කරන්න පුළුවන්නම් හොඳයි. ඒ වාගෙම සුපිරි වෙළඳ සංකීර්ණයේ වැසිකිළිය කඩිනමින් පිරිසිදු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු ප්‍රා.ස.ම.යූ.ජී.ධර්මසිරි මැතිතුමා.</u>**

මිද්දෙනිය පොළෙහි ඉඩ මදි. පොළට යාබද අක්කර 03 ක් තියනවා. එයාල ඉඩම අපිට දෙන්න කැමතියි. ගොඩ කරලා හදා ගන්න පුළුවන්. එම ඉඩම ගන්න පුළුවන්නම් හොඳයි. කවදා හරි මිද්දෙනිය නගරයට ඉතිරි වෙන්නෙ ඒ ඉඩම විතරයි. ඉඩම අරගෙන බැකුවට තියලා මුදල් ගෙවන්න වුණත් පුළුවන්. ඒ නිසා මෙම ඉඩම ලබා ගන්න.

**<u>ගරු සභාපති අයි.ජී.මහින්ද මැතිතුමා</u>**

අපිට මාළු අපද්‍රව්‍ය දාන්න තැනක් නැති නිසා ලොකු ගැටළුවක් ආවා. ඒ නිසා මාළු වෙළඳුන්ටම ඒවා අරගෙන යන්න කිව්වා. දැන් ඔවුන් ඒවා රැගෙන යනවා. මොවුන්ට අපද්‍රව්‍ය එක් ස්ථානයකට දාන්න කිව්වට වැඩක් නැහැ. අහන්නෙත් නැහැ. දැනුවත් කිරීම් කරලා තියෙන්නේ. ඒත් වැඩක් වෙලා නැහැ. අපේ මන්ත්‍රීවරු සියළු දෙනා මිද්දෙනිය පොලේ සංචාරය කරලා බලන්න. මිද්දෙනිය පැරණි පොළ පැවති මහජන බැංකුව ළඟට තොග පොළ ගමු. එවිට තොග පොළෙහි ආදායමත් වැඩි වෙයි.

**<u>ගරු ප්‍රා.ස.ම.කේ.සුනිල් ශාන්ත කුමාර මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, මිද්දෙනිය, මුරුංගස්යාය, වැලිපිටිය ආදී ප්‍රදේශ රැසකට සභාව හරහා වතුර ලබා දෙනවා. එම වතුර බීමට ගැනීම ලොකු ගැටළුවක්. දැන් හැම තැනම වතුර නිසා රෝගාබාධ වැඩියි.

දැන් තිබෙන ජලය පිරිපහදු කිරීමේ ක්‍රමය අසාර්ථකයි. ජනතාවට පානය කිරීමට ගතහැකි හොඳ වතුර ටිකක් ලබා දෙන්න.

**<u>ගරු ප්‍රා.ස.ම.ඩබ්.එච්.ජී. සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා.</u>**

සභාවෙන් දෙන වතුර අපි බොන්නෙත් නැහැ. මීද්දෙනිය නගරය අවට බෝතල් කළ වතුර බොනවා. සමහරු වැලිපිටිය නළ ළිඳෙන් වතුර ගේනවා. අපි එහෙම බිව්වට දුප්පත් ජනතාවට ඒක කරන්න අමාරුයි. හරිස්චන්ද්‍ර මන්ත්‍රීතුමා ගරු අමරවීර මැතිතුමාට කියලා මේ වෙනුවෙන් ප්‍රතිපාදනයක් වෙන් කර ගෙන විසඳුමක් ගන්න බලන්න. මීද්දෙනිය නගරයට තිබෙන ලොකුම ගැටළුව ජල ගැටළුවයි.

**<u>ගරු සභාපති අයි.ජී.මහින්ද මැතිතුමා</u>**

අපි මීද්දෙනිය නගරයට හොඳ වතුර ටිකක් ලබා දෙන්න ලොකු උත්සහායක් කළා. ඒත් බැරි වුණා. අපි අඩු මුදලකට පිල්ටර් කර වතුර ලබා දෙන්න උත්සාහ කරමු.

**<u>ගරු ප්‍රා.ස.ම.රමනි හල්පෙ ගමගේ මැතිතුමිය.</u>**

සභාපතිතුමනි, වෙළඳගොඩ, අගලබඩ මාර්ගය හදිසි කටයුත්තක් කියලා වැහැව්වා. නමුත් තවම විවෘත කලේ නැහැ. රෝහලට, පොළට, පාසලට මේ නිසා ලොකු දුරක් යන්න වෙලා තියනවා. ඒ වාගෙම වැවේ දොර ඇරියම ලොකු දුර්ගන්ධයක් එනවා. එහෙම වෙලා තියෙන්නෙ ඇයි? ඒ වාගේම අපේ පැත්තේ පාසල්වලට කසල බඳුන් ලබා දෙන්න කියා ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති අයි.ජී.මහින්ද මැතිතුමා</u>**

වෙළඳගොඩ අගලබඩ මාර්ගය සම්බන්ධීකරණ කමිටුවට යොමු කර සිදු වී ඇත්තේ කුමක්ද කියා සොයා බලමු. වැවේ නම් යට මඩ පිරිලා තියන නිසා දොර ඇරියම දුගඳක් එනවා. ඒකට අපිට කරන්න දෙයක් නැහැ. අපි කසල බඳුන් බොහෝ ස්ථානවලට ලබා දී තිබෙනවා. ඉදිරියේදී මේ ස්ථානවලට ලබා දෙමු. කසල බඳුන් ලබා ගන්න ආයතන සම්බන්ධ කර ගන්න වෙනවා.

**<u>ගරු ප්‍රා.ස.ම.එම්.පී.සී. කැලුම් තුෂාර ගරුසිංහ මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමාගෙන් අවසරයි. කරමැටිය පොළ පිළිබඳ ලොකු ගැටළුවක් තියනවා. දැන් අවුරුදු තුන හතරක් වෙනවා. නමුත් පොලේ වැඩ භාගෙට නැවතිලා. වැඩ කරන්න ගෙනත් තිබුණු භාණ්ඩත් නැවත අරගෙන ගිහින්. පොළ හදන්න තිබුණු මුදලින් සේවකයින්ට පඩි ගෙවලා. මහින්ද අමරවීර මැතිතුමා, සජිත් පේමදාස මැතිතුමා මෙම පොළට වරින් වර මුල්ගල් තිබ්බා. නමුත් වැඩ කෙරුණේ නැහැ. හරිස්චන්ද්‍ර මන්ත්‍රීතුමා, මෙහොට්ටි මන්ත්‍රීතුමා මේ සඳහා ප්‍රතිපාදන වෙන් කර ගෙන පොළ හදන්න බලන්න. කරමැටිය පොළ පිළිබඳ විගණනයක් කරන්න පුළුවන්නම් හොඳයි.මෙම පොළ සකස් කිරීමේදී අත්තනෝමතික වැඩ ගොඩක් වෙලා තියනවා. කරමැටිය පොළ වටිනවා. ඒ නිසා ඉතිරි වැඩ කටයුතු ආරම්භ කරන්න සහයෝගලය ලබා දෙන්න කියා ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති අයි.ජී.මහින්ද මැතිතුමා</u>**

අපි කරමැටිය පොළ සකස් කිරීමට අදාළ ආයතන ගෙන්වා සාකච්ඡාවක් පවත්වමු. රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට පොළ සකස් කිරීමට අදාළ සියළු මුදල් ගෙවා තිබෙනවා. නමුත් එම ආයතනය මඟින් තවම වැඩ සම්පූර්ණ කර නැහැ.

**<u>ගරු ප්‍රා.ස.ම.සිරිසේන හෙට්ටිගේ මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, ජනතාව පිළිබඳ කවුරුත් කතා කළාට අපි ගැන කවුරුත් කතා කලේ නැහැ. අපිට අද දීමනාව ලැබිලා තියනවා. ඒ ගැන සතුටුයි. අපි සියළු දෙනාටම ලිපි ලියන්න ලිපි ශීර්ෂ පොත් ලබා දෙනවා. එමෙන්ම මන්ත්‍රී ධූරයත් සමඟ බලප්‍රදේශයට අදාළව සාමවිනිසුරු පදවිය ලැබී තිබෙනවා. ඒ සඳහා සීල් එකක් හදා ගන්න. ලබන සභා වාරයට දින පොත් ලබා දෙන්න කියා ඉල්ලා සිටිනවා. අපි වෙනුවෙන් ලබා දෙන, ලැබෙන්න තියන දේවල් තවම නවක මන්ත්‍රීවරු දන්නෙ නැහැ. ඒ වගේම

මෙතැනින් එළියට ගිය ගමන් ගරු මන්ත්‍රීතුමා කියලා කතා කරන්න පුරුදු වෙන්න. ඒක වටිනවා. පක්ෂ පාට භේද දැන් අවසන්. අපිට තියෙන්නෙ සාමකාමීව එකා වගේ බලප්‍රදේශයේ ජනතාවට වැඩ කරන්න. ඒ දේ හරියට කරමු.

**<u>ගරු ප්‍රා.ස.ම.ඩබ්.ඩී.එම්.ඩී. හරිස්චන්ද්‍ර මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමා. බොහෝ මන්ත්‍රීවරු කතා කළා. අපි නිහඬව සිටියා. අපි කියන දේවල් ඉටු කර ගෙන අපි හිතාගෙන ඉන්න තැනට අපිට එන්න පුළුවන්ද කියලා මුලින්ම හිතලා බලන්න ඕන. හම්බන්තොට දිස්ත්‍රික්කයට කැබිනට් ඇමතිවරු දෙදෙනෙක් ඉන්නවා. සංවර්ධන කටයුතු කරන්න පුළුවන්. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා කාලේ දැවැන්ත සංවර්ධනයක් කළා. ඒ කාලයේ කරමැටිය පොළ සකස් කරන්න වැඩ ආරම්භ කළා. දේශපාලන අරමුණු විවිධ වූ නිසා කරමැටිය පොළ දැන් තිබෙන තත්ත්වයට පත් වී තිබෙනවා.

දේශපාලන පක්ෂ, පාට භේද නැතිව වැඩ කරමු කිව්වා. අපි ජාතික දේශපාලනයේ සිටින නායකයින් වගේ වෙන්න ඕන නැහැ. ගරු මහින්ද අමරවීර මැතිතුමා කටුවන ප්‍රාදේශීය සභාවේ සංවර්ධනය සඳහා ප්‍රතිපාදන ලබා දුන්නා. සභාව 2018 වර්ෂය සඳහා පොළ ටෙන්ඩර් කරන්න හැදුවා. අරවින්ද මන්ත්‍රීතුමා කතා කරලා වෙන්න යන අවධානම නවත්වන්න කියලා මට කිව්වා. ඒ නිසා සම්බන්ධීකරණ කමිටුවේදී නව සභා කාලය ආරම්භ වන තෙක් තිබෙන ක්‍රම වේදයට පොළ පවත්වා ගෙන යන්න කිව්වා. ගරු මහින්ද අමරවීර මැතිතුමාට නගරයේ ජනතාව ආදරෙයි. එතුමා සභාවට ගෙන්වා ගෙන සාකච්ඡාවක් වුණත් කරන්න පුළුවන්.

මිද්දෙනිය නගරය අලංකරණය මෙන්ම මිද්දෙනිය පොදු වැසිකිලිය යනාදිය මූලික කර ගත් නගර සංවර්ධන සැලැස්ම හරියට ක්‍රියාත්මක වුනේ නැහැ. මිද්දෙනිය නගර සංවර්ධන සැලැස්ම හරියට කරමු. දැනට අවිධිමත් සැලැස්මක් තියනවා. නගර සංවර්ධනයේදී ප්‍රාදේශීය සභාව පුළුල් වෙන්න ඕන. සභා ගොඩනැගිල්ලක් මිද්දෙනිය නගරයට අවශ්‍යයි. ඇස්තමේන්තුවක් සමඟ සභා ගොඩනැගිල්ලේ සැලැස්මක් සකස් කර තියන්න. ප්‍රතිපාදන ලබා දෙන අවස්ථාවක එය ඉදිරිපත් කර අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගන්න පුළුවන්. ඒ වාගේම මිද්දෙනිය ප්‍රාථමික විද්‍යාලය නගරයෙන් දුරකට යන්න ඕන.

කුමා ස්ටිකර් ආයතනයට අපගේ සුපිරි වෙළඳ සංකීර්ණය ලබා දුන්නා. නමුත් එය නිසි පරිදි සිදු වුණේ නැහැ. සභාවේ තිබුණු සැලැස්ම වෙනස් කරමින් එතුමා වැඩ කළා. ඒවාට අපි සහාය දුන්නා. නමුත් නගරසේ සංවර්ධනය සඳහා තවම එය අවසන් කරන්න කටයුතු කර නැහැ. අද වන විට අපිට පෙන්වපු තත්ත්වය වෙනස් වෙලා. එම ශාලාවේ වැඩ පටන් ගන්නෙ නැතිනම් නැවත තිබුණු තත්ත්වයට හදන්න කියන්න. අපිට අවශ්‍යතාවයකට ශාලාව ගන්න පුළුවන්. ඒ වාගේම සුපිරි වෙළඳ සංකීර්ණය පිරිසිදු කරන්න.

පෙර සභා වාරවල මිද්දෙනිය නගරය වෙනුවෙන් කතා කලේ මමයි අරවින්ද මන්ත්‍රීතුමයි පමණයි. මිද්දෙනිය ජල ව්‍යාපෘතිය ගත් කළ එය භාවිතා කරන ජනතාවගෙන් 90% ක්ම භාවිතා කරන්නේ බෝතල් කළ පානීය ජලයයි. නිවෙස්වල නාන කාමර, වැසිකිළි මෙන්ම ටයිල් අල්ලන ලද ස්ථාන ගන්න දෙයක් නැහැ. මුරුතවෙල ජල යෝජනා ක්‍රමය සාර්ථකයි. එය දීර්ඝ කර මිද්දෙනිය නගරයට ජලය ගේන්න පුළුවන්. එම ජල යෝජනා ක්‍රමය මැදමුදන, ජුලම්පිටිය දක්වා පැමිණ තිබෙනවා. එම ජල යෝජනා ක්‍රමය ලබා ගන්න උත්සාහ කරමු. හිටපු ලේකම් කුමාර මහතා ජල ගැටළුව විසඳන්න ලොකු වෙහෙසක් දැරුවා.

අපි ජනතාවගේ මෙන්ම සහෝදර මන්ත්‍රීවරුන්ගේ දානයට, උත්සව වලට හා මළ ගෙවල් සඳහා සහභාගී වෙනවා. අද සිට අපි ගන්න දීමනාවෙන් රු.500 ක මුදලක් වෙන් කර මන්ත්‍රී සුබසාධන අරමුදලක් ආරම්භ කරමු. මිනිස්සු අපෙන් යමක් බලාපොරොත්තු වෙනවා. අපිට මේ පිළිබඳ අත්දැකීම් තියනවා. අද දවසේ සභාව තුළ පක්ෂ කිහිපයක මන්ත්‍රීවරු පත් වී පැමිණ සිටිනවා. අපි ඒ පිළිබඳ සතුටු වෙනවා. සභාවට හොඳ අනාගතයක් තියනවා. සභාව හොඳ මට්ටමකට ගන්න කටයුතු කරමු.

**ගරු ප්‍රා.ස.ම.කේ.ඒ. ප්‍රේමතිලක මැතිතුමා.**

කටුවන සභාව පැවති ගොඩනැගිල්ල කඩන ලද ස්ථානයේ සාමාන්‍ය ගොඩනැගිල්ලක් හෝ ඉදිකරන්න. දේශීය ණය සංවර්ධන අරමුදලෙන් හෝ මුදල් ලබා ගෙන එය ඉදි කරමු. ඒ වාගේම ලීසිං දාලා හරි සභාවට ගලි බවුසරයක් ගමු. සභාවකට ගලි බවුසරයක් තියෙන්න ඕන.

**ගරු සභාපති අයි.ජී.මහින්ද මැතිතුමා**

හරිස්චන්ද්‍ර මැතිතුමා දීර්ඝ කතාවක් කළා. අගුණුකොළපැලැස්ස ජල යෝජනා ක්‍රමය මඟින් මෙම ප්‍රදේශයට ජලය ගෙන ඒම පිළිබඳ පෙර සභා වාරවලදී අපි කතා කළා. නමුත් එය ඉටු කර ගන්න බැරි වුණා. මේ වන විට මිද්දෙනිය ප්‍රදේශයේ ජල ගැටළුව විසඳා තියනවා. කුඩගොඩ ප්‍රදේශයේ ලක්ෂ 50 ක් වටිනා ජල ව්‍යාපෘතියක් ඉදි කර විවෘත කළා. ඒ සඳහා පැවැත් වූ උත්සවයට අපේ සනත් මන්ත්‍රීතුමා ලොකු වියදමක් දැරුවා.

කටුවන ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල හදන්න දළ ඇස්තමේන්තුවක් සකස් ප්‍රතිපාදන ලබා ගන්න අනුමැතියට යවා තියනවා. එම ගොඩනැගිල්ල කඩිනමින් හදන්න කටයුතු කරනවා. 53 – 1634 කැබ් රථය අළුත්වැඩියා කළ පසු අපේ මන්ත්‍රීතුමන්ලාට අත්‍යවශ්‍ය කටයුතුවලදී භාවිතා කරන්න ලබා දෙන්න පුළුවන්.

## 12 . ස්තුතිය හා නිමාව.

කටුවන ප්‍රාදේශීය සභාවේ 08 වන සැසි වාරයේ සමාරම්භක රැස්වීම අද දින මිද්දෙනිය උප කාර්යාලීය සභා රැස්වීම් ශාලාවේදී පවත්වනු ලැබුවා. අද දින නවක මන්ත්‍රීවරු සමඟ මන්ත්‍රී ධූර සංඛ්‍යාව 30 ක් දක්වා වැඩි වී තිබෙනවා. නමුත් අද දින ගැටළුවකින් තොරව සභාවේ කටයුතු පවත්වා ගෙන යාමට හැකියාව ලැබුණා. සභාවේ වැඩ කටයුතු සාර්ථකව කර ගැනීම සඳහා සහයෝගය ලබා දුන් ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීවරු සියළු දෙනාටමත්, ලේකම් මහතා ඇතුළු නිලධාරීතුමියටත්, මාධ්‍යවේදී මහතාටත් මාගේ ආදරණීය ස්තුතිය පුද කරනවා යැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

ප.ව. 2.30 ට පමණ සභා තොමෝ සතුටින් විසිර ගියහ.

.........................

අයි.ජී. මහින්ද,

සභාපති,

කටුවන ප්‍රාදේශීය සභාව,

මිද්දෙනිය.